Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2022), Vol. 07 (02)

# A Study of the Tax System Associated with the Ancient Irrigation System and the use of the Proceeds for Temple Purposes Revealed by the Source of the Epigraphy

M. A. P. Kumara

Department of Humanities, Rajarata University, Sri Lanka

**Article Info**

Article History:
Received 31 Dec 2021
Accepted 31 Aug 2022
Issue Published Online
01 July 2022

**Key Words:**
Management
Irrigation
Revenue
Administration
Tank Land

*Corresponding author
E-mail address:
prasadmallawaarachchi85@gmail.com

https://orcid.org/0000-0002-3766-8763

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v07i02.12

VJHSS (2022), Vol. 07 (02), pp. 165-179

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

Faculty of Humanities and Social Sciences 2022

## ABSTRACT

*This study is an epigraphy sourced inquiry into the taxation system associated with the ancient irrigation system of Sri Lanka and the use of that revenue for rural needs. Tank land is the most popular type of land that was donated for temples by royalty, nobles as well as common people. Its incomes have been used in an organized manner to fulfill the needs of the residents, to successfully fulfill religious functions, as well as for the restoration processes of the temple. The research problem here was whether the tank lands given for temples and their income were used for temple needs with proper management. The main objective of this study was to conduct a study on the tank lands offered for temples during the Rajarata kingdoms and their revenue management. To identify how Viharaya emerged as a property-owning organization, investigate the contribution and involvement of Bhikshu in the management of the revenue shares of a lake, investigate the legal provisions in the use of the revenue of the tank lands for temple needs, etc. was implemented as sub-objectives of this research. The research method used here is the historical research method. The conclusions of this research were reached by studying the data obtained in a comparative and analytical manner based on the information revealed by epigraphical sources, limiting to the Rajarata civilization stage. The conclusion reached here was that due to the taxes obtained from the tank lands made for the temples and those revenues were used with proper management to meet the needs of the residents, an orderly temple administration system had been built at the same time.*

**මාතෘකාව**

ශ්‍රී ලංකාවේ පැරණි වාරි පද්ධතිය හා බැඳුණු බදු ක්‍රමය සහ එම ආදායම් ආරාමික අවශ්‍යතා සඳහා යෙදවීම පිළිබඳ අභිලේඛන මූලාශ්‍රයාගත විමසුමක්

## 1. හැඳින්වීම

"ශ්‍රී ලංකාවේ පැරණි වාරි පද්ධතිය හා බැඳුණු බදු ක්‍රමය සහ එම ආදායම් ආරාමික අවශ්‍යතා සඳහා යෙදවීම පිළිබඳ අභිලේඛන මූලාශ්‍රයාගත විමසුමක්' මෙම පර්යේෂණය මගින් සිදු කෙරේ. ලංකාවේ භික්ෂු සංස්ථාවෙහි ඒකායන පරමාර්ථය වූයේ ලෞකික බැඳීම්වලින් සම්පූර්ණයෙන් ඈත්ව ලෝකෝත්තර දියුණුව පිණිස ආගමික කාර්යයන්ගේ නිමග්න වීමයි. ධනය, ධනෝපායන මාර්ග ආදී සියලු ම ආර්ථික කටයුතුවලින් වියුක්තව මානසිකව නිදහස් ජීවිතයක් ගත කිරීම එහි මූලික අවශ්‍යතාව විය. පුරාතන ලංකාවේ විහාරස්ථ ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ සළකා බලන විට පැහැදිලි ව පෙනෙන්නට තිබෙන තත්ත්වය නම් තම ලෙනට හෝ ආරාමයට පිදෙන ඉඩම් සකල සංඝයා උදෙසා ම පිළිගැනීමේ සම්ප්‍රදායයි. විනය පිටකය සඳහන් කරන්නේ භික්ෂුවක් හට වස්තුව පිළිගැනීම, පාලනය කිරීම හා භුක්ති විඳීම ද ඇතුළත්ව සියලු ලෞකික කටයුතුවලින් වැළකී සිටිය යුතු බවකි (ගුණවර්ධන, 1993). බුද්ධඝෝෂ හිමියන් සඳහන් කරන ආකාරයට 'කුඹුරක්, ඉඩමක්, වැවක් හෝ ඇළක් වැනි නිශ්චල දේපොළ කිසිවක් පාලනය නොකිරීම, නොපිළිගැනීම හා පිළිගැනීමට නොකැමති වීම භික්ෂු සංඝයාට ඔබින, ඔවුන් විසින් පිළිපැදිය යුතු ගුණාංගයකි. එහෙත් එබඳු දේපොළ ගිහියෙකු මාර්ගයෙන් පරිපාලනය කරනු ලබන්නේ නම් ඊට අවසර ඉඩ ඇත' යනුවෙන් ප්‍රකාශ කර තිබේ (සමන්තපාසාදිකාව, 2003). ප්‍රකාශයේ දැක්වෙන ආකාරයට සංඝයාගේ නඩත්තුව සඳහා පිදෙන දේපල භික්ෂුවක් විසින් පරිපාලනය කළ යුත්තේ ගිහියෙකු මාර්ගයෙන් බව නියම කොට ඇත. භික්ෂු ගහණය වැඩිවත් ම ආරාම ප්‍රමාණය ද ඊට සාපේක්ෂව වැඩි වූ අතර මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ භික්ෂු අවශ්‍යතා සංකීර්ණ වීමයි. නේවාසිකයන්ගේ අවශ්‍යතා සපුරාලීමත්, ආගමික අවශ්‍යතා පිරිමසාලීමත් සඳහා විහාරයට ස්ථාවර ආදායම් මාර්ගයක් අත්‍යවශ්‍ය විය. මේ හේතුව නිසා ම බෞද්ධ සංඝයා සහ විහාරාරාම සඳහා රජු, ප්‍රභූවරුන් සහ සාමාන්‍ය ජනතාව විසින් විශාල වශයෙන් ඉඩම් ප්‍රදානය කරන ලදී.

විශේෂයෙන් විහාර උදෙසා රජවරුන්, ප්‍රභූවරුන් හා සාමාන්‍ය ජනතාව විසින් පූජා කරන ලද ඉඩකඩම්, ගම්වර, වැව්, පොකුණු ආදිය විහාර සන්තක දෝපොළ වශයෙන් සඳහන් වේ. මෙයින් පැහැදිලි වන එක් කරුණක් වන්නේ පැවිද්දන්ගේත්, විහාරවලත් සංඛ්‍යාව ක්‍රමක්‍රමයෙන් වැඩි වන විට එකී නේවාසිකයන්ගේ වුවමනාවන් නිතිපතා සැපයීම ද, ආගමික වත් පිළිවෙත් පැවැත්වීම ද, තම ගොඩනැගිලි නඩත්තු කිරීම ද, යන අවශ්‍යතා සඳහා විසඳුමක් වශයෙන් විහාරස්ථ දේපොළ ක්‍රමයක් ආරම්භ වූ බවයි. මෙහි අවසාන ප්‍රතිඵලය වශයෙන් භික්ෂුව හා විහාරය දේපොළ හිමි සංවිධානයක් ලෙස ඉදිරියට එනු දැකගත හැකි ය.

විහාරවලට ආදායම් උපදින මාර්ග වශයෙන් වැව් ඉඩම් ප්‍රදානය කිරීම අඩුම තරමේ ක්‍රි.පූ. දෙවැනි සියවසේ සිටවත් ආරම්භ වන්නට ඇති බව මූලාශ්‍රය සාධක විග්‍රහ කර බැලීමෙන් පැහැදිලි වේ. 'වැව' යන නාමය 'ජලාශය' යන අරුතින් 'වපි' 'වවි' හෝ 'වාපි' යනුවෙන් බොහෝ මූලාශ්‍රයවල යෙදෙනු දැකිය හැකි ය. ශ්‍රී ලංකාවේ පැරණි වාරි පද්ධතිය හා බැඳුණු බදු ක්‍රමය සහ  එම ආදායම් ආරාමික අවශ්‍යතා සඳහා යෙදවීම පිළිබඳ අභිලේඛන මූලාශ්‍රයාගත විමසුමක් මෙම අධ්‍යනයෙන් සිදු කෙරේ. අභිලේඛන මූලාශ්‍රයවලින් හෙළිවන රජරට සභ්‍යත්ව අවධියේ විහාරාරාම සඳහා ප්‍රදානය වූ වැව් ඉඩම් සහ ඒවායින් ලබා ගත් බදු විහාර අවශ්‍යතා සඳහා යෙදවීම පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. විහාරය දේපොළ හිමි සංවිධානයක් ලෙස ඉදිරියට පැමිණි ආකාරය හඳුනා ගැනීම, වැවක ආදායම් කොටස් කළමනාකරණයෙහි ලා භික්ෂුවගේ දායකත්වය සහ මැදිහත්වීම කෙබඳු ද යන්න විමසා බැලීම, වැව් ඉඩම්වල ආදායම් විහාර අවශ්‍යතා සඳහා යෙදවීමේ දී පැවති නෛතික විධිවිධාන පිළිබඳ විමර්ශනය ආදිය මෙම පර්යේෂණයේ අනු අරමුණු ලෙස ක්‍රියාත්මක විය.

විහාරාරාම උදෙසා සිදු කරන ලද වැව් ඉඩම් මගින් ලබාගත් බදු සහ එම ආදායම් නේවාසිකයන්ගේ අවශ්‍යතා පූරණය කිරීම සඳහා නිසි කළමනාකරණයකින් යුක්තව භාවිත කළේ ද? යන පර්යේෂණ ගැටලුව ඔස්සේ යමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. රාජකීයයන්, වංශවතුන් මෙන් ම සාමාන්‍ය ජනයා විසින් ද විහාරාරාම උදෙසා පූජා කරන වැව් ඉඩම් නිසා ආර්ථික බලයේ යම් හැසිරවීමක් ද භික්ෂුව සන්තක වී තිබේ. වැව් මගින් ලැබුණු බදු  ආදායම් නේවාසිකයන්ගේ කුදු මහත්  අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහාත්, ආගමික කාර්යයන් සාර්ථකව ඉටු කර ගැනීම සඳහාත් මෙන් ම විහාරයේ කැඩුම් බිඳුම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලි සඳහාත් සංවිධානාත්මකව යොදවා ගෙන තිබේ. මෙම පර්යේෂණ ගැටලුවේ පවත්නා මූලික වැදගත්කම වන්නේ රාජ්‍ය ආදායම් රටේ සංවර්ධනය සඳහා යොදවන විට ඒවා විධිමත්ව සහ විනිවිද භාවයකින් යුක්තව යෙදවුණු ආකාරය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් පර්යේෂණය ඔස්සේ හෙළිදරව් කර ගැනීමට හැකි වීමයි. එම ආදායම් කිසිදු ආකාරයේ අවභාවිතාවකට ලක් වූ බවක් අදාළ යුග තුළ පෙනෙන්නට නොතිබිණි. එකී ආදායම නීත්‍යනුකූල ලෙස වෙන් කරන්නේ කුමන කාර්යයක් සාධනය සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ නිසා විහාරාරාම පාලන ක්‍රියාවලිය ද සාර්ථක අන්දමින් පවත්වා ගැනීමට හැකියාව නිර්මාණය වූ බව පැහැදිලිව පෙනෙන්නට ඇත. එය නූතනයට පවා ආදර්ශ සපයන ක්‍රියාවලියකි. රාජ්‍ය ආදායම් ආගමික සංස්ථාවන්ගේ සංවර්ධනය සඳහා යොදවන විට ඒවා නිසි කළමනාකාරීත්වයකින් යුතුව යෙදවීම පිළිබඳ ක්‍රමවේදයන් හඳුනා ගත හැකි නිසාත්, එම ආදර්ශ නූතනයේ ද ප්‍රායෝගික භාවිතාවට ලක් කළ

හැකි නිසාත්, එය රටේ සංවර්ධනයට සෘජුව බලපාන නිසාත් මෙම පර්යේෂණ ගැටලුව කාලීන වැදගත්කමක් උසුලයි. මෙහි පර්යේෂණ සීමාව ලෙස රජරට සභ්‍යත්ව අවධිය හා එම අවධියට අයත් අභිලේඛන මූලාශ්‍රය තෝරා ගැණිනි. විහාරාරාම සඳහා ප්‍රදානය කළ වැව් ඉඩම් මගින් ලබාගත් බදු විහාර නේවාසිකයන්ගේ අවශ්‍යතා පූරණය කිරීම සඳහා නිසි කළමනාකරණයකින් යුක්තව භාවිතය ලක් වූ බව හා එය ක්‍රමවත් විහාර පරිපාලනයකට ඉවහල් වූ බව යන තාවකාලික උපන්‍යාසය මත පිහිටා මෙම පර්යේෂණය දියත් කර ඇත.

ලංකාවේ විවිධ විද්වතුන් රැසක් මෙරට විහාර ඉඩම් ප්‍රදාන සහ ආදායම් කළමනාකරණ ක්‍රියාවලිය අළලා විවිධ පර්යේෂණ ග්‍රන්ථ රැසක් එළි දක්වා තිබෙනු දැකිය හැකි ය. ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය, පළමු කාණ්ඩය I, II භාගවල (ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය, පළමු කාණ්ඩය I, II භාග, 2015) රජරට සභ්‍යත්වය තුළ ක්‍රියාත්මක වූ දේපොළ ක්‍රමය සහ ආදායම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ පරිච්ඡේදයේ කොටසක් වශයෙන් ගෙන සාකච්ඡා කර ඇතිමුත් විහාර ආරාම සඳහා වෙන් වූ වැව්වලින් සපයාගත් බදු ඒවායේ කටයුතු පවත්වා ගැනීම උදෙසා නිසි කළමනාකාරීත්වයෙන් යොදා ගත් ආකාරය පිළිබඳ ප්‍රමාණවත් විග්‍රහයක් සිදු කර නොමැත. එච්.ඩබ්. කොඩ්රින්ටන් මහතා විසින් රචනා කරන ලද Ancient Land Tenure and Revenue in Ceylon (Codington, 1938) නම් ග්‍රන්ථයේ ද මෙරට ක්‍රියාත්මක ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ දීර්ඝව සාකච්ඡා වී තිබේ. ලංකා සිවිල් සේවයේ නියුක්තව සිටි එච්.ඩබ්. කොඩ්රින්ටන්ගේ එම කෘතිය අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් 'ලංකා පුරාණ ඉඩම් භුක්තිය හා ආදායම්' (කොඩ්රින්ටන්, 1938) නමින් සිංහලයට පරිවර්තනය කොට තිබේ. ඉඩම්වල ආධිපත්‍යය, ඉඩම් වර්ගීකරණය (වගාව අනුව හා අයිතිකරු භුක්ති විඳි අයිතිය අනුව), සේවා භුක්ති ක්‍රම සහ වෙනත් භුක්ති ක්‍රම, අයබදු සහ ගෙවීම් වැනි අනුමාතෘකා ඛණ්ඩ කිහිපයක් යටතේ මධ්‍යතන යුගය පිළිබඳ විශේෂ අවධාරණයක් යොමු කරමින් සාකච්ඡා කොට ඇත. ග්‍රන්ථයේ කතුවරයා විසින් 'රජු සියලු ඉඩම්වල අයිතිකරුවාය' යන මූලික පදනම මත සිටිමින් ඉඩම් භුක්තිය පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් සිදු කර ඇත. 'සියලු ඉඩම්වල පරම අයිතිය රජුට ය' යන සන්දර්භය මත පිහිටා නිගමනවලට එළඹීම එතරම් නිවැරදි නොවන බව හා සාමාන්‍ය ජනයා මෙන් ම භික්ෂුව අත ද විහාර ඉඩම් භුක්තිය සංසරණය වූ ආකාරය පිළිබඳ අදාළ මූලාශ්‍රය සියුම්ව අධ්‍යයනය කර බැලීමෙන් පෙනීයයි.

සිරිමල් රණවැල්ලයන් විසින් රචිත 'පුරාතන ලංකාවේ ආර්ථික ඉතිහාසය' (රණවැල්ල, 2003) නම් කෘතිය මඟින් ද 'ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්තිය හා විහාර ඉඩම් ප්‍රදාන පිළිබඳ ග්‍රන්ථයේ එක් පරිච්ඡේදයක කොටසක් වශයෙන් ගෙන සාකච්ඡා වී තිබේ. ග්‍රන්ථයේ ප්‍රථම පරිච්ඡේදය ලෙස දක්වා ඇති 'කෘෂිකර්මාන්තය' නමැති මාතෘකාව යටතේ ඉඩම් අයිතිය හා භුක්තිය, ඉඩම් වගාව, කෘෂිකර්මාන්තය සම්බන්ධ නිලධාරීන් හා බදු ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ඡාවක් අන්තර්ගත වී ඇත. මෙම අධ්‍යයනය තුළ වුව රජරට සභ්‍යත්වය තුළ ක්‍රියාකාරී වූ විහාර ඉඩම් භුක්තිය හා වැවකින් සපයා ගත් බදු ආදායම් ඒවායේ අවශ්‍යතා පූරණය සඳහා යෙද වූ ආකාරය පිළිබඳ ප්‍රමාණවත් විග්‍රහයක් සිදු කර නැත. 'The Ceylon Journal of Historical and Social Studies" සඟරාවේ පළමු කලාපයෙහි 1971 දී පළ කරන ලද ලිපියක් මගින් ඉන්ද්‍රකීර්ති සිරිවීරයන් ඉඩම් හිමිකම පිළිබඳ විග්‍රහ කර තිබේ (සිරිවීර, 1960, 10-18 පිටු). The Theory of the Kings Owership of Land in Ancient Ceylon : An essay in Historical Revision' නමින් පළ කරන ලද එම ලිපියෙහි රජරට සභ්‍යත්ව අවධියේ විහාර දේපොළ ක්‍රමය පිළිබඳව එහි යම් තරමකට සාකච්ඡා වී තිබුණත් විහාර සන්තක වැව් ඉඩම් හා ඒවායේ ආදායම් කළමනාකරණය පිළිබඳ කිසිදු අවධානයක් යොමු කර තිබුණේ නැත. එනිසා මෙම පර්යේෂණ හිඩැස පිරවීම සඳහා මෙම පර්යේෂණය මගින් යම් පිටිවහලක් වනු ඇත.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී භාවිත පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයයි. මූලික වශයෙන් පුස්තකාල අධ්‍යනය සිදු කරන ලද අතර ඒ යටතේ ප්‍රස්තුතයට අදාළ ව මෙතෙක් පළ වී ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනයට ලක් කෙරිණි. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය යටතේ ගිරි ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි, ආදී අභිලේඛන මූලාශ්‍රය අධ්‍යනය කළ අතර කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන හා වාර්තා, රැසක් අධ්‍යයනයට ලක් කෙරිණි. සෙනරත් පරණවිතාන, ඉන්ද්‍රකීර්ති සිරිවීර වැනි විද්වතුන් ඉදිරිපත් කළ පර්යේෂණ හා නිරීක්ෂණ වාර්තා ද දෙවන මූලාශ්‍රය වශයෙන් පරිශීලනය කෙරිණි. ආරාමවලට කළ වැව් ඉඩම් ප්‍රදාන හා ඒවායේ කළමනාකරණ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රයක් වශයෙන් ***මහාවංසයට*** විශේෂ වැදගත්කමක් හිමි වේ.

***මහාවංසයේ ප්‍රථම භාගය*** ක්‍රි.ව. 5 වැනි සියවසේ දී දික්සඳ සෙනෙවියා පිරිවෙන්පති මහානාම හිමියන් විසින් රචිත ය. විශේෂයෙන් ආගමික සංස්ථාව හා බැඳුණු දේශපාලන ක්‍රියාදාමයන් විස්තර කරන විට පුරාතන ලංකාවේ කෘෂිකර්මාන්තය, වාරි කර්මාන්තය, වෙළෙඳාම, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය, ඉඩම් බදු ප්‍රතිපත්තිය වැනි කාරණා රැසක් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හැකියාව ලැබේ. වසභ මහ රජු විසින් මුචෙල විහාරය ඉදිකොට ඇළිසතර දිසා භාගය එම විහාරයට පුදන ලද බව ***මහාවංසයේ*** සඳහන් වීම ද විහාර සන්තක ඉඩම් හා ආදායම් සම්බන්ධ වැදගත් තොරතුරකි.

> *"මුචෙල විහාරං කාරෙත්වා*
> *සො තිස්සවඩ් ඪකහ මානකෙ*
> *ඇළි සා රොදක භාගං*
> *විහාරස්ස අදාපයී"* (මහාවංසය, 1996).

මහසෙන් රජුගෙන් අවසන් වූ ***මහාවංසයෙහි*** නැවතුණ තැන සිට I වන පරාක්‍රමබාහු රජුගේ කාලය දක්වා වංසකතාව ධම්මකිත්ති නම් හිමිනමක් විසින් පසුකලක රචනා කරන ලද අතර එය '***චූලවංසයේ I වන කාණ්ඩය'*** ලෙස මෙම අධ්‍යයනයේ දී භාවිත වෙයි. ජෙට්ඨතිස්ස හෙවත් දෙටුතිස් කුමරු නුවරට අවුත් රජ පදවි ලබා අභයගිරියට මහාදාරගිරිය ද, මහාවිහාරයට මාමෙක්බෝව ද, ජේතවනයට ගොඩිගමුව ද, මයිලගන හා දිඹුලාගන යන ගම් දෙක පදන්ගෙයි නායක වූ මහානාග තෙරුන්ට ද, කසුබ්ගිරියට ගොදුරුගම් කොට අඹලප නම් ගම ද, වේළුවනයට කැකුළුවිට ගම ද, ගංගාමාතික විහාරයට කෙහෙත නම් ගම ද, අතුරුගං වෙහෙරට චූලමාතික ගම ද, ඔයෙන් වැව කසුබ් වෙහෙරට කනන්නරුව ගම ද, කළාට වෙහෙරට උදාගම ද වශයෙන් ගම් පරිත්‍යාගයන් සිදු කළ අයුරු ***මහාවංශයේ*** දක්වා තිබේ (මහාවංසය, 1996) දෙවැනි සේන රජ දවස (ක්‍රි.ව. 353-887) ලෝහ ප්‍රාසාදයට ' භෝගගාම ' යනුවෙන් හැඳින්වුණු ගම් ප්‍රදානයක් සිදු කර ඇත (ගුණවර්ධන 1993). මහාවිහාරයේ බෝධිඝරයට සිව්වැනි දප්පුල (ක්‍රි.ව. 924-935) රජු විසින් සිදු කරන ලද ගම් ප්‍රදානයක් පිළිබඳ ව ***චූලවංසයෙහි*** සඳහන් වේ (චූලවංසය, 1925). සිව්වැනි මහින්ද (ක්‍රි.ව. 956-972) රජු ද මිරිසවැටි විහාරයේ වන්දනාපාසාදයට 'භොගගාම' පවරා තිබේ (චූලවංසය, 1925). වංසකතා ගෙන එන මෙකී විස්තරවල මහාවිහාර පාර්ශ්වයට ප්‍රමුඛතාව දී තිබුණත් අනෙකුත් නිකාය මධ්‍යස්ථාන උදෙසා දුන් ගම් පරිත්‍යාග පිළිබඳව ද විටින් විට දක්වා තිබේ. පළමු වැනි සේන රජු ජේතවන විහාරයේ තමන් විසින් ඉදිකරන ලද වාසස්ථානයට මහාභෝග හෙවත් විශාල ආදායම් ලැබීමට සැලැස් වූ බව ***චූලවංසයෙහි*** දක්වයි (චූලවංසය, 1925). ඒ අනුව විහාර සඳහා ප්‍රදානය කරන ලද ගම් සියල්ල ම ඒවායේ පැවති වැව් සමඟ විහාර සන්තක කළ නිසා එම ආදායම් විහාර අවශ්‍යතා සඳහා යොදවා ගැනීම පිළිබඳ යම් තොරතුරු ප්‍රමාණයක් ***මහාවංසයෙන්*** හා ***චූලවංසයෙන්*** ලබා ගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ ආරාමවලට කළ ඉඩම් ප්‍රදාන හා ඒවායේ ආදායම් කළමනාකරණ ඉතිහාසය පිළිබඳ හැදෑරීමේ දී ඒ සඳහා තොරතුරු ලබා ගත හැකි අභිලේඛන රාශියක් දිවයිනේ විවිධ ප්‍රදේශවලින් හමු වී ඇත. විශේෂයෙන් රජරට සභ්‍යත්ව අවධියේ බොහෝ ශිලා ලේඛනවල දක්නට ලැබුණේ ගම්, කුඹුරු සහ වැව් ඉඩම් විහාර සන්තක කිරීම පිළිබඳව ය. මෙම ඉඩම් හා බැඳි බොජකපති, දකපති වැනි බදු වර්ග ලබා ගැනීම් සම්බන්ධ තොරතුරු ද ශිලා ලේඛනවල පැහැදිලි ව සඳහන් කෙරිණි. මෙවැනි ශිලා ලේඛන රැසක් මෝලාහිටියවෙලේගල, පෙරුමියන්කුලම, පාලුමැකිච්චාව, නාගිරිකන්ද, රාස්සහෙල, ආදී ස්ථානවල දක්නට ලැබේ. උදාහරණ වශයෙන් ක්‍රි.ව. 6 වන සියවසට ගැනෙන මහකුමරතස රජුගේ නාගිරිකන්ද ලිපියෙහි (Nagirikanda Inscription, Epigraphia Zeylanica, Vol. IV, 1994) බමණගිරි විහාරයට පුද පඬුරු ලෙස සිදු කරන ලද කුඹුරු හා වැව් පිදීමක් පිළිබඳ ව සඳහන් කර ඇත. 'මහගරිය වෙවසර (ෙ)චද චුගරිය වෙවසර (ෙ)ච කටචනක - පුල සර වෙ (ෙ)වච (ෙ)ච ම චතර වෙවසර දක පෙත කඩය බෙජිපෙත බමණගිරිය වහෙරෙ බික සඟහට චර පචයට දිනෙ' මහගිරිය වැව හා වෑසර ද, චුගරිය වැව හා වෑ සර ද, කබුබෙ වැව සහ වෑසර ද, කටචනක වැව හා වෑසර ද යන මේ වැව් සතර සහ වෑසර මහකුමරතස රජු විසින් බමණගිරිය විහාරයට සිව්පසය සඳහා ප්‍රදානය කොට තිබේ. මෙම තොරතුර අනුව සමකාලීන යුගය තුළ කුඹුරු ඉඩම සහ වැව් ඉඩම විහාර අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී යොදා ගත් වැදගත් ධනෝපායන මාර්ගයක් වූ බැව් පැහැදිලි වේ. විහාර දේපොළ කළමනාකරණය කළ විධිමත් ක්‍රමවේද හා ඒවායේ සමකාලීන වැදගත්කම හඳුනා ගැනීම, ඒවායේ නූතන උපයෝගිතාවන් අවශ්‍යතාව කෙබඳු ද යන්න හඳුනා ගැනීමේ දී මෙම මූලාශ්‍රය දත්ත ඉතා වැදගත් වේ. මෙරට ඉතිහාසඥයන් සහ පුරාවිද්‍යාඥයන් විසින් සිදු කරන ලද පර්යේෂණ මගින් සමකාලීන විහාරවලට සිදුකරන ලද ප්‍රදාන පිළිබඳ සඳහන් අභිලේඛන මූලාශ්‍රය රැසක් සොයා ගෙන ඇතත් ඒවා සම්පූර්ණයෙන් විධිමත් විශ්ලේෂණයකට බඳුන් කර නැත. ඇතැම් විට මේවා කොළඹ සහ මහනුවර ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත්ව ඇති අතර ඇතැම් ඒවා අදාළ විහාරාරාමවල ම දක්නට ඇත. මෙරට දක්නට ලැබෙන වංසකතා ප්‍රමුඛ සාහිත්‍ය මූලාශ්‍රය රැසක මෙම විහාරාරාමවලට අයත් දේපොළ ප්‍රමාණ සහ ආදායම් පිළිබඳ යම් තොරතුරු ප්‍රමාණයක් දක්නට ලැබේ. එම තොරතුරු සහ සංඛ්‍යාලේඛනවල නිරවද්‍යතාව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය සාධක තුළින් අනාවරණය කර ගැනීම මෙම පර්යේෂණයේ එක් පැතිකඩක් නියෝජනය කරනු ලබයි. එම දේපොළ විධිමත් කළමනාකරණයට ලක් වූ අන්දම විග්‍රහ කර ගැනීම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මෙවැනි ක්‍රමවේද ඔස්සේ ලබාගත් දත්ත රැසක් මෙම පර්යේෂණයේ දී දායක කර ගන්නා අතර එම දත්ත සන්සන්දනාත්මකව සහ විශ්ලේෂණාත්මකව පර්යේෂණයට බඳුන් කරමින් නිගමනවලට එළඹීම සිදු කර ඇත.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

අතීත සමාජ ක්‍රමය තුළ පාලකයා හා ජනතාව අතර අත්‍යන්ත බැඳීමක් පැවති අතර රාජ්‍යය සාර්ථකව පවත්වා ගෙන යාමට රජයට අවශ්‍ය මුදල් රැස් කරගත් එක් මාධ්‍යයක් වූයේ බදු අයකර ගැනීමයි. රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වූයේ මෙම බදු ය. විශේෂයෙන් ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම රාජ්‍ය


පාලකයාගේ යුතුකම බව **දීඝ නිකායේ** ද සඳහන් වේ (දීඝ නිකාය, අග්ගඤ්ඤ සූත්‍රය, වෙළුම III, 1998). මහජනතාව විසින් රජයට බදු ගෙවීම සහ ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගැනීම බුද්ධ කාලීන සමාජය තුළ ද සිරිතක් වශයෙන් පැවති බව සූත්‍ර දේශනාවන්හි සඳහන් වේ. 'බලි' 'බලිග්ගාහක' යනුවෙන් පාලි සූත්‍ර දේශනාවන්හි සඳහන් වන්නේ බදු හා බදු අයකරන්නන් සම්බන්ධයෙනි. 'බලි' යන්න 'බදු' හෙවත් 'බද්ද' යන අර්ථය ගෙන දෙන බව **පාලි ශබ්දකෝෂයෙහි** (Pali Dictionary, 1993) සඳහන්ව ඇත. **නාරදගේ නීති ශාස්ත්‍රය** වැනි පැරණි ඉන්දීය කෘතිවලට අනුව බදු අය කිරීමේ පරමාර්ථය වූයේ රජු විසින් රට වැසියාට සලසන ආරක්ෂාව වෙනුවෙන් රට වැසියා විසින් කරනු ලබන ප්‍රත්‍ය උපකාරයක් ලෙස ය (බෂාම්, 1995). ඒ සඳහා භූමියෙන් ලැබෙන හයෙන් එකක් රජුගේ ආදායම ලෙස ගෙවිය යුතු විය. **මානවධර්ම ශාස්ත්‍රයට** අනුව අස්වැන්නෙන් හයෙන් එකක් බදු වශයෙන් අය කිරීම සාමාන්‍ය සිරිත විය (කොඩ්රිංටන්, 1938). එහෙත් එය අවස්ථානුකූලව හතරෙන් එකක් දක්වා වැඩි කිරීමට හෝ අටෙන් එකක් දක්වා අඩු කිරීමට රජුට අයිතිය පැවති බව දැක්වේ. **අර්ථශාස්ත්‍රයේ** එන තොරතුරුවලට අනුව ඉන්දියානු සමාජයේ ඉඩම්වලින් අයකර ගන්නා ලද බද්ද හතරෙන් එකක් ලෙසත්, සරු ඉඩම් වලින් තුනෙන් එකක් ලෙසත් දක්වා තිබේ (රණවැල්ල, 1984). ලංකාවේ ඉඩම් භුක්ති සංකල්පය තුළ ද සරු නිසරු බව මත බදු ප්‍රමාණය නියම වී තිබුණි. 12 වන සියවසට අයත් නිශ්ශංකමල්ලයන්ගේ ශිලා ලිපියක (අමරවංශ, 1969) ඊට නිදර්ශන සැපයේ. 'පෙර රජුන් දවසැ වඩා ගන්නා අය හැර උත්තේ අමුණට එකමුණු තුන් පැල හා මඩිරන් සාක හා මැන්දෙ අමුණට එකමුණු දෙපැළ හා මඩිරන් සතරක හා පැස්සේ අමුණට එකමුණු පැළ හා මඩිරන් තුන බැගින් ගනුත් මුත් වඩා නොගන්නා නියා'මේ අනුව සරුසාර කුඹුරුවලින් වැඩි බදු ප්‍රමාණයක් ද, තරමක් සරු ඒවායින් ඊට අඩු ප්‍රමාණයක් ද, නිසරු ඒවායෙන් ඊටත් අඩු ප්‍රමාණයක් ද අයකර ගත යුතු බව දක්වා තිබේ. බොහෝ ශිලා ලිපිවල 'උත කුබරකර' නමින් හැඳින්වෙන්නේ සරුසාර කුඹුරු ය.

පුරාතන ලංකාවේ ඉඩම්වලින් අයකර ගන්නා ලද බද්ද හයෙන් එකක් වන බව පෙරුමියන්කුලම ලිපියේ (Perumiyankulam Inscription, Epigraphia Zeylanica, Vol. II, 1994) විස්තරාත්මකව දක්වා තිබේ. 'සකොටසෙන් එක කොටසපති' යනුවෙන් දැක්වෙන්නේ එයයි. මේ සාධක අනුව රට වැසියා විසින් රජුට බද්දක් ගෙවිය යුතු බවත්, බදු වර්ග, බදු එකතු කළ නිලධාරීන්, බදු අය කරන ක්‍රමවේදය හා බදු කඩකළවුන්ට දෙන දඬුවම් ආදිය පිළිබඳ ව අභිලේඛන මූලාශ්‍රය මගින් තොරතුරු ලැබේ. වැව් ඉඩම් භුක්තිය හා බැඳි බදු ක්‍රමය පිළිබඳව මෙහි ලා විශේෂ අවධානයක් යොමු කෙරේ.

කෘෂිකාර්මික ජීවිතයක් ගත කළ මිනිසාට ගොවිතැන සඳහා ජලය අවශ්‍ය වූ අතර ධනවතුන් හා රජවරුන් වැව් තනවා ගොවියාට ජලය සපයා දුන් බවට මූලාශ්‍රය සාධක වේ. මෙසේ ජලය සපයන විට ජල සම්පත්වල හිමිකාරත්වය ලැබූ රජය හෝ වෙනත් හිමිකරුවන් ජල බදු ලබාගත් ආකාරය පිළිබඳව සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රය මගින් තොරතුරු ලැබේ. අවම වශයෙන් ක්‍රි.පූ. 1 වන සියවසේ දී පමණ ආරම්භ වන ජල බදු අය කිරීම ක්‍රි.ව. 14 වන සියවස තෙක් ම ක්‍රියාත්මක වූ බවට සාධක ඇත. අභිලේඛන මූලාශ්‍රයවලට අනුව මෙම බද්ද ක්‍රි.පූ. 1 - ක්‍රි.ව. 03-04 කාලවල දී 'දකපති' යනුවෙන් හඳුන්වා ඇත. සංස්කෘත භාෂාවෙහි 'උදකප්‍රාප්ති' ලෙසත් පාලියෙහි 'උදකපත්ති' ලෙසත් එන මෙය දකපති, දකපතිය, දකපෙති ආදී විවිධ ස්වරූපයන්ගෙන් දක්නට ලැබේ. **මහාවංසයෙහි** "දකභාගං" වශයෙන් හඳුන්වන්නේ දිය බද්ද වේ. '... මුචෙල විහාරං කාරෙත්වා සොතිස්ස වඩ්ඪමානතේ ආලිසාරෙ දකභාගං විහාරස්ස අදාපයි...' දකපති යනු 'දියෙන් ලැබෙන ආදායම' බවත්, දකබක හෙවත් උදක භාග යනු ' දිය කොටස්' ලෙසත් අර්ථ ගැන්වේ. 'දක' යනු ජලය වන අතර 'ජලයෙන් ලබන ආදායම හෙවත් ජලය වෙනුවට රජයට ගෙවන අස්වැන්නෙන් කොටස' දිය බද්ද වේ. **කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයේ** දක්වන ආකාරයට 'තම ශ්‍රමය යොදවා වාරිමාර්ග ඉදිකොට වගා කරන අය 'උදකභාගං' වශයෙන් භෝගයෙන් පහෙන් එකක් ද වතුර කර පිටින් ගෙන ගොස් වගා කරන අය හතරෙන් එකක් ද, ආඬි ළිංවලින් ජලය ගෙන වගා කරන අය තුනෙන් එකක් ද, ගංගා, විල් වැව් හා ළිංවලින් ජලය ගන්නා අය තුනෙන් එකක් හෝ හතරෙන් එකක් ද ගෙවිය යුතු බව දක්වා තිබේ. 'දකපති' යන්න නිර්වචනය කරන වික්‍රමසිංහ දක්ෂපති (having seen), උදකපති (lord of waters) සහ උදක ප්‍රාප්ති වශයෙන් අර්ථ තුනක යෙදිය හැකි බව දක්වයි (Epigraphia Zeylanica, Vol. II, 1994). සෙල්ලිපි මූලාශ්‍රයට අනුව උදක ප්‍රාප්තිය හෙවත් ජල බද්ද යන අදහස බෙහෙවින් ගැළපෙන බව ඔහුගේ අදහස වී තිබේ. ක්‍රි.ව. 6-7 සියවස් වන විට දකපති යන්න නාමිකව වෙනස් වීමකට ලක්වන අතර 'දිය බෙදුම්' ලෙස දැක්වීම ඇරඹී ඇත (Epigraphia Zeylanica, Vol. III, 1994). ක්‍රි.ව. 13 වන සියවස වනවිට දිය බද්ද "පිසඹුරුවත" ලෙස ද නිශ්ශංකමල්ලයන්ගේ ශිලා ලේඛනවල දක්වා තිබේ. 'නොඑක් මහවැතැන අවශේෂ ප්‍රාණීන්ට උභය දී නොමරණ නියායෙන් සම්මත කොට පිසඹුරුවත සෙහෙන්...' (Epigraphia Zeylanica, Vol. I, 1994).

යම් යම් අවස්ථාවල දී කුඹුරු හිමියන් විසින් හෝ කුඹුරු කරන්නවුන් විසින් තම කුඹුරුවලට ලබන ලද ජලය වෙනුවෙන් ගෙවන ලද 'දකපතිය' හෙවත් 'දිය බදු ගාස්තුව' කරිසයකට අමුණක ප්‍රමාණයක් වූ බව අංක 159 දරණ මෝලාහිටියවෙලේගල ශිලා ලිපියෙන් අනාවරණය වේ. 'සිධම් සෙන පුත වහබයෙ ක (ටෙල) වසක වව් ච අහුරවිකි ච විල පවතෙහි අති සිමිය ගණවය තුම හ අසනක දකපතිය කරිහ අමිණිය බක බිකු සගහටය දිනි...'

(Malahitiyawelegala inscription, Inscriptions of Ceylon, Vol. II, Part II, 2001). පෙළෙහි දැක්වෙන ආකාරයට කුඹුරු හිමියන් විසින් හෝ කුඹුරු කරවන්නන් තම කුඹුරුවලට ලබා දෙන ලද ජලය වෙනුවෙන් ගෙවන ලද ගාස්තුව කරීසයකට අමුණකි. එම අමුණක ප්‍රමාණය ලබන්නේ වැව් හිමියා යි. කරිසයක් යනු අමුණු හතරකි. ඒ අනුව හතරෙන් එකක් දකපති ගාස්තුව වශයෙන් ගෙවීමට ඉඩම භුක්ති විඳින්නාට සිදු වේ. මෙහි අමුණක ප්‍රමාණය අස්වැන්නෙන් අමුණක ප්‍රමාණය වන්නට ඇතැයි කල්පනා කළ හැකි ය. බක්කිඇළ ශිලා ලිපියේ ද (Bakkiela Inscription,Inscriptions of Ceylon, Vol. II, Part I,1983) එක් කුඹුරු කරීසයකට එක් අමුණක් බැගින් සිදු කළ ගෙවීමක් පිළිබඳ ව සඳහන් කරයි. ලජක තිස මහරජ අබ (ල) කෙතවි කනවය කුබිලවි තිස පවත හ දිනි. මෙහි දකපතියහි (තිණි බකහි බක බක) තිස මහරජ (දිනෙ) කුබිලවි තිස පවත විහරහි' ලිපියේ පෙළෙහි දැක්වෙන ආකාරයට කරීස හත්සියයක කුඹුරෙහි එක කරීසයකට එක අමුණ බැගින් ප්‍රමාණයක් එහි බදු අවලංගුකොට කුබිලවි තිස පවත විහාරයට ප්‍රදානය කිරීමක් පිළිබඳ ව සඳහන් කරයි. කරීස 700ක් යනු අමුණු 2800 කි. අමුණු 2800කට අමුණු 700ක් දකපති ගාස්තුව වශයෙන් ගෙවා ඇති බව මෙ නයින් පැහැදිලි වේ. එය තරමක් විශාල ගාස්තුවක් ලෙස හඳුනාගත හැකි ය. කුඹුරේ විශාලත්වය හා ඊට සැපයෙන ජල ප්‍රමාණය පදනම්ව කරීසයකට එක් අමුණක් බැගින් වන සේ ගෙවීමක් සිදු කිරීමට ඉඩම් හිමියාට සිදු වී තිබෙන බව පැහැදිලි ය.




**රූප සටහන 1.** වැව් ඉඩම් භුක්තිය හා බැදි පරිපාලන ව්‍යුහය

සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රයවල ජල බදු පිළිබඳ ව පැහැදිලිව සඳහන් කර නැත. කෙසෙල්, පුවක්, මුං, බුලත්, දොඩම් ආදී ගොඩ බෝග වගාව වෙනුවෙන් අය කළ බද්දක් පිළිබඳව කොණ්ඩවට්ටවාන ලිපියෙන් (අමරවංශ, 1969) තොරතුරු අනාවරණය වේ. මෙකී බදු අය කරන ලද්දේ ගොඩ ඉඩම් වලට සපයන ලද ජලයෙන් විය හැකි ය. එයින් අනාවරණය වන අනෙක් කාරණය නම් ජල සම්පාදනය සඳහා පිරිවැය දරන කවරකුට වුව ද පෞද්ගලිකව ඒ සඳහා පරිභෝජකයාගෙන් බද්දක් ලබා ගැනීමට අයිතියක් පැවති බව ය. ප්‍රධාන වශයෙන් ම රජු සහ ඇතැම් රට වැසියෝ වාරි ජල සම්පත් වලට හිමිකම් කියූ බවත්, එමගින් ලබා ගත් ආදායම රජයේ විශාල ආදායම් මාර්ගය වූ බවත් අභිලේඛන මූලාශ්‍රය මගින් තහවුරු වේ. එකී ප්‍රදානයන් බොහෝ විට විහාරවල සිවුපසයට, දිරූ දේ පිළිසකර කිරීමට හා නඩත්තු කටයුතු උදෙසා ප්‍රදානය කෙරිණි. ඇතැම් විහාරවල පරිභෝජනය හා ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් 'දකපති බද්ද' ප්‍රදානය කළැයි ඍජුවම දැක්වීම සිදුකර ඇත. මෙසේ අයකර ගන්නා ලද බදු එකතු කිරීමට "දොළොස්මහා වෑ තැන" නම් නිළධාරී පිරිසක් පත්කොට සිට ඇත. මෙසේ ජල සම්පාදන ව්‍යාපාරයට යොදාගත් ශ්‍රමය වෙනුවෙන් වැටුප් ගෙවන්නට ද රජයට සිදු වූ බවට මූලාශ්‍රය සාධක වේ. 'කර්ම කිරීමට නියමිත කාල දෙමාස් පස් දිනකි. එය පිළිවෙලින් නොකරන්නා වූ කම්කරුවන්ට ද වැරියන් ද කම් දෙටුවන්ට ද දොස් පැමිණේ. ඒ දෝෂ ඉවත්කර නොගන්නා වූ කම්කරුවන්ගේ වැටුප් නැවැත්විය යුතුය...' (අමරවංශ, 1969) ජේතවනාරාම සංස්කෘත ලිපියෙහි දක්වා ඇත. මෙහි එන 'වැරියර්' හෙවත් 'වැරි' යනු 'රාජකාරී ශ්‍රමය' ලෙස පරණවිතානයන් අර්ථ ගන්වා ඇත. මෙසේ සළකා බලනවිට ජේතවනාරාම සංස්කෘත ලිපියට අනුව රාජකාරී ශ්‍රමය සපයන්නන් සහ කම්කරුවන් යන දෙවර්ගයක් සේවය කළ බව පැහැදිලි ය.

මෙකී නිලධාරී මණ්ඩලයෙන් සැදුම්ලත්ව වැවක් පරිපාලනය වූ අතර වැවකින් හෝ ඇළකින් ජලය ලබා දීමේ දී අයකරගත් දිය බදු කිසියම් පදනමක් මත ගෙවන්නට ඇත. ඉන්දියානු පරිසරය තුළ අතින් දිය ඇද වගා කරන අස්වැන්නෙන් හතරෙන් එකක් ද, ජල යන්ත්‍රයෙන් දිය ලබා වගා කරන අස්වැන්නෙන් තුනෙන් එකක් ද, ගංගා, තටාක, වැව් වලින් වගා කරන අස්වැන්නෙන් තුනෙන් එකක් ද වශයෙන් බදු අය කරගත යුතු බව පෙර සඳහන් කෙරිණි. ලාංකේය පරිසරය තුළ මීට සමගාමී නිර්ණායකය වන්නට ඇත්තේ වැවට පැවති ආසන්නතාව, වැව් ජලය ලබන බිම් ප්‍රමාණය හෝ කුඹුරෙහි සරු නිසරු භාවය විය හැකි ය. වැව ආසන්නයේ කුඹුරුවලට වැඩි ජලය ලැබීමත්, දුරින් පිහිටි කුඹුරුවලට අඩු ජලය ලැබීමත් නිසා බදු ප්‍රමාණය ද ඊට සාපේක්ෂව වෙනස් වී තිබේ. නිශ්ශංකමල්ලයන්ගේ ගල්පොත ශිලා ලිපියට (Galpotha Inscription, Epigraphia Zeylanica, Vol. II, 1994) අනුව උත්තේ අමුණු 01 ට (සරු කුඹුරු) අමුණු 01යි පැල් 03යි මඩරන් 07ක් ද, මැද්දේ අමුණු 01 ට (තරමක් සරු කුඹුරු) අමුණු 01යි පැල් 02යි මඩරන් 04ක් ද, පැස්සේ අමුණු 01 ට (නිසරු කුඹුරු) අමුණු 01යි පැල් 01යි මඩරන් 03ක් ද වශයෙන් ගෙවීම සිදුකළ යුතු ආකාරය දක්වා ඇත. ජලය බෙදා හැරීමේ දී පවා සාධාරණ පිළිවෙතක් තිබී ඇති අතර 'වෙස්සගිරි ලිපියෙහි' (Vessagiri Inscriptions, Epigraphia Zeylanica, Vol. I, 1994) ඉසුරුමුණි විහාරයට ජලය නිකුත් කිරීමේ දී 'මොහොල් නඟා දිය කැට පහණ පෙනෙන තෙක්...' ජලය නිකුත් කළ බව දක්වා ඇත. 'පෙරවැරි බුද්' යනුවෙන් ඇළවල් සීමා ලකුණු කරන නිළධාරීන් පිළිබඳ ව තොරතුරු ලැබෙන නිසා ජල බදු අය කිරීමේ කිසියම් ප්‍රමිතිකරණයක් තිබෙන්නට ඇති බව අනාවරණය වේ. ලාස්, කුරුණි, යාල්, පැල්, හුනක්, මඩරන් සහ අමුණු වැනි මිණුම් ක්‍රම පිළිබඳව ද තොරතුරු අනාවරණය වන නිසා දිය බදු අය කිරීම ද ධාන්‍ය මෙන් ම මූල්‍යමය වශයෙන් සිදු කරන්නට ඇති බව පැහැදිලි ය.

බොජකපති, බොජියපති, බොජිපති, බෙජිපති, බෙජිපෙත යනාදී විවිධ නම්වලින් සෙල්ලිපි මූලාශ්‍රයවල හමුවන 'බොජකපති' බද්ද රජවරුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ බව පෙනේ. කොත්මලේ අමරවංශ හිමි පෙන්වා දෙන්නේ 'ඔ' හට 'එ' වීම 'ඉ' පරත්වය නිසා හොජක - බෙජි වශයෙන් විවිධාකාර ස්වරූප දැකිය හැකි බව සඳහන් කරයි (අමරවංශ, 1969). මෙම 'පති' ශබ්දය සංස්කෘත භාෂාවේ 'ප්‍රාප්ති' ලෙසත් පාලි භාෂාවේ 'පත්ති' ලෙසත් යෙදී ඇති අතර 'බදු' යන අර්ථය එහි වේ. ***සුමංගල ශබ්ද කෝෂයෙහි*** (සුමංගල ශබ්දකෝෂය 1999) 'ආදායම' ලෙස දක්වා තිබේ. විජයතුංග මහතාගේ අදහසට අනුව පුරාණයේ දී ලක්දිව ඉඩම්වල ආදායමෙන් 'රජයට ගෙවූ බද්ද' හෙවත් කොටස 'බොජකපති' වේ (සුමංගල ශබ්දකෝෂය, 1999). සෑම මාර්ගයකින් ම රජුට ලැබෙන ආදායම් කොටස, රජුට ලැබෙන ඉඩම් බද්ද, ඉඩම් හිමියාගේ අදායම යනාදිය 'බොජියපති' නමින් හඳුන්වන බව තවත් අදහසක් වේ. කොත්මලේ අමරවංශ හිමියන් දක්වන්නේ පෙරුමියන්කුලම ලිපියේ එන 'සකොටස' 'බොජකපති' වන බව ය (අමරවංශ, 1969). වැව් හා ගම් පාලනය කළ මුලාදෑනීන්ට හෙවත් හෝජකයන්ට ගම්වැසියන් විසින් ගෙවනු ලැබිය යුතු වූ බද්ද 'බොජකපති' වන බව මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියන්ගේ අදහස වී තිබේ. 'භෝගපත්ති' යන්නට විවරණ සපයන පරණවිතාන ශූරීන් එය රජතුමාට ආදායමින් දිය යුතු කොටස ලෙස අරුත් ගන්වා ඇත (Epigraphia Zeylanica, Vol. III, 1994). අනුරාධපුර මැද භාගය තෙක් මෙම බද්ද 'බොජකපති' ලෙසත් පසුව මෙය අය බද්ද ලෙසත්, 10 වන සියවසේ දී 'දෙකරලින් බදු' ලෙසත් දක්වා ඇත.

මතෙර මජිබක යනුවෙන් ද පුරාණයේ පැවති බද්දක් පිළිබඳව සඳහන් වේ. අනුරාධපුර යුගයේ මුල්

කාලයට අයත් බද්දක් වන මෙය මතරමපිබක, මතරමපිබික, මතිරමපිබක, මතෙරමපිබකි, මතෙරමපිබුක හා මතෙරමපිබිකපති යනුවෙන් විවිධාකාරයෙන් සඳහන් වී ඇත. විමලකීර්ති හිමියන් දක්වන ආකාරයට භික්ඛු ශබ්දයට බිකු, බුක, බික යනාදී රූපයන් ගැනීමට හැකි වුවත් එය නොගැළපෙන බවකි. උන්වහන්සේට අනුව බිකු, බුක, බික ශබ්දයන්ගේ මුල් රූපය 'බක' වන අතර එය භාග ශබ්දයෙන් බිඳීමට හැකි බවකි. 'මතෙර' යනු 'ඇල' යන ශබ්දය ගෙන දෙන නිසා 'මතෙරමපිබක' යනු ජලය සම්බන්ධයෙන් අය කළ බද්දක් බවත්, මෙය වැව්, අමුණු, ඇළ ආදියෙන් අය කරන ලද 'මච්ඡභාග' නම් වූ විශේෂ බද්ද බවක් දක්වා තිබේ. මහරත්මලේ ශිලා ලිපියෙහි එන 'මපිබක' යන්නට අරුත් සපයන වික්‍රමසිංහ මහතා මපිබක යන්නෙන් මපිබුක නම් තෙර නමක් පිළිබඳ ව අදහසක් ඉදිරිපත් කර ඇති අතර මුලර් මහතා ද මෙම මතය පිළිගෙන තිබේ. මෙම මතය ප්‍රතික්ෂේප කරන පරණවිතාන ශූරීන් 'මපිබක' යන්නෙන් 'මත්ස්‍ය භාගය' හෙවත් 'මාළු ඇල්ලීමෙන් ලැබෙන ආදායම් කොටස'යන අදහස ගෙන දෙන බව (Epigraphia Zeylanica, Vol. IV, 1994) දක්වා තිබේ. 'මපිබක' යන්න සෑම තැනක ම යෙදී ඇත්තේ වැවක් පිළිබඳව සඳහන් කිරීමෙන් පසුව බව දක්වන ඔහු 'මපිබක' යන්නට පෙර මතෙර-මතිර-මතර යන ශබ්දවලින් එකක් සෑම විටම යෙදී ඇති බව සඳහන් කරයි. ඇළ මාර්ගවලින් මසුන් අල්ලන්නන්ගෙන් අය කරනු ලැබූ බද්දක් වන බව පරණවිතානයන් ගෙන එන අදහස පිළිගැනීමට නොහැකි ව්‍යාකූල අවස්ථා ද දැකිය හැකි ය. විශේෂයෙන් අභිලේඛන මූලාශ්‍රය පරීක්ෂා කර බලන විට මෙම බද්ද වැඩි වශයෙන් පූජා කර තිබෙන්නේ විහාරාරාම වෙත ය. පුරාණ බෞද්ධ භික්ෂූන් ප්‍රාණය නිරුද්ධ කරන ලද බද්දක් ලබා ගත්තා ද යන්න ඇතැමෙකු තර්ක කළ හැකි ය. තවත් අතකින් බලන විට භික්ෂුව සඳහා සිදු කරන ලද වැව් ප්‍රදානයක දී ඇළ අමුණු ප්‍රදානයක දී එහි සියලු ම ආදායම් කොටස් දීමට සිදු වේ. ඒ නිසා මෙකී බද්ද ද වැවේ ආදායම් කොටසක් ලෙස කල්පනා කිරීමට ද සිදු වේ.

වසභ රජුගේ පෙරුමියන්කුලම ශිලා ලිපියේ (Perumiyankulam Inscription, Epigraphia Zeylanica, Vol. I, 1994) විහාරයකට කරන ලද ප්‍රදානයක් පිළිබඳ ව දක්වා තිබේ. '..අමරතනෙහි කෙතවලක වවිය දකපති තුමහ පිත සතක කොටසහ තිපතිය නහති මපිබිනක සතනනි මෙ දකපතිය ස කොටස පති සොවණ බෙර පහරවය දිනි' අංක 58 දරණ රුවන්වැලි දාගැබ් ලිපියෙහි ගජබාහු ගාමිණී අබය රජු විසින් සිදු කරන ලද බොජකපති හා දකපති ප්‍රදානයන් පිළිබඳ ව සඳහන් කරයි. ලිපියේ සඳහන් ආකාරයට වසභ රජුගේ මුණුබුරු වූ ද, තිස්ස මහ රජුගේ පුත් වූ ද මහරජ ගජබහු ගාමිණී අභය දක්ඛිණ අභය ආරාම විහාරය කරවා වරුකවිය වැවෙහි 'බොජිකපති' ආදායම උපෝසථාගාරයෙහි පිළිසකර කටයුතු සඳහා රන් කෙණ්ඩියෙන් පැන් වත්කොට එකී ආරාමයට පරිත්‍යාග කර තිබේ. එසේ ම මෙම වැවෙහි ජලයෙහි ආදායම භික්ෂු සංඝයා හට සිවුපසය පරිභෝජනය කිරීම සඳහා පරිත්‍යාග කර තිබේ. ලිපියේ සඳහන් කරන ආකාරයට වැවේ ආදායම් කොටස් දෙකක් රජු විසින් යොදවා ඇත්තේ ස්ථාවරව දක්වන ලද අවශ්‍යතා දෙකක් වෙනුවෙනි. මෙහිලා වැවේ 'බොජකපති ආදායම'ලෙස දක්වන්නට ඇත්තේ වැවේ ජලයෙන් වගා කරන ඉඩමෙහි බද්ද හෙවත් ධාන්‍ය බද්ද ය. ඒ අනුව පාලකයාගේ කොටස හෙවත් භෝජකයාගේ කොටස විහාරයට ප්‍රදානය කිරීමක් සිදු ව ඇත. 'දකපතිය' යනු එකී කුඹුරුවලට ජලය සැපයීමෙන් ලබා ගත් බද්ද යි. එය ද භික්ෂූන්ගේ සිවුපසය පරිභෝජනය සඳහා ප්‍රදානය කර තිබේ. මෙම සියල්ල සිදු කරන්නේ රන් කෙණ්ඩියෙන් අත පැන් වත්කොට සම්මත ක්‍රමවේදයකට අනුව ය.

අංක 60 දරණ ථූපාරාම ලිපියෙහි ද (Thuparama Inscription, Inscriptions of Ceylon, Vol. II, Part I, 1983) මෙවැනිම 'දකපති' හා 'බොජකපති' ප්‍රදානයක් පිළිබඳව දක්වයි. ලිපියේ පෙළෙහි දක්වන ආකාරයට මහරජ ගාමිණී අභය විසින් නගරංගණයෙහි ගිරිඋත වැවෙහි ජලයෙහි ආදායම ද බොජකපති ආදායම ද රත්න ආරාම විහාරයෙහි භික්ෂු සංඝයා හට සිවුපසය පරිභෝජනය කිරීම සඳහා පරිත්‍යාග කර තිබේ.ලිපියේ එන "නකර ගණක...නකර වවිය දක පති පරිවවට කොටු දිනෙ" යන්න තරමක් ව්‍යාකූල පසුබිමක් නිර්මාණය කරයි. එහි සඳහන් ආකාරයට නගරයෙහි ගණකාධිවරයා නගර වැවෙහි ජලයෙහි ආදායම මෙයට හුවමාරුවක් වශයෙන් ලබා දීමක් සිදුකර ඇත. එහෙත් මෙම හුවමාරුව කුමක් ද යන්න පැහැදිලි නැත.

අංක 72 දරණ තම්මැන්නාකන්ද ලිපියෙහි වැව් තුනක (Thammannakanda Inscription, Inscriptions of Ceylon, Vol. II Part I, 1983) බොජියපති ආදායම විහාරයකට පරිත්‍යාග කිරීමක් පිළිබඳ ව සඳහන් කරයි. 'සිද්ධම් (1) උපල අව බිජකහි පජලක වවිය චො පල අවිය වවය චො උතරපර අතනෙහ මණිකරගමක වවිය චො ය තිනි වවය බොජිය ප (තිය) කර කඩය නක මහරජි පජිනි නක පවත වෙහිරහි බිකු සගහට දිනි' ලිපියේ දැක්වෙන ආකාරයට නාග මහ රජ විසින් උපල අව බිජකහි පජලක වැව ද, පල අවිය වැව ද, උතරපර වෙළඳ ආයතනයෙහි මණිකර ගමක වැව ද යන වැව් තුනෙහි බොජියපති ආදායම නාග පබ්බත විහාරයෙහි භික්ෂු සංඝයා හට ප්‍රදානය කර තිබේ. ලිපියෙන් පැන නැගෙන විශේෂ ම කාරණය නම් වැව් තුනට අදාළ බොජියපති ආදායම එම ආදායමට ගෙවිය යුතු බදු අවලංගු කොට විහාරයට ප්‍රදානය කළ බව දක්වා තිබීම ය. එකී ප්‍රදානයන්වල දී විහාරාරාම අයබදුවලින් නිදහස් කරන ප්‍රදානයන් සිදු කිරීමට වගබලාගෙන ඇති බවට සාධක රැසක් අභිලේඛන මූලාශ්‍රය මගින් හෙළිදරව් වේ. තම්මැන්නාකන්ද ලිපියෙන් පැන නැගෙන්නේ ද එවන් තත්ත්වයකි. අංක 79 දරණ නෙලුගල ශිලා ලිපියෙහි ද (Thammannakanda Inscription,

Inscriptions of Ceylon, Vol. II Part I, 1983) තවත් මෙවැනි ම දකපති ප්‍රදානයක් පිළිබඳව දක්වා ඇත.

නෙලුගල ලිපියට අනුව පයගලක අහලි පවත විහාරය කරවන්නේ ඇමති අහලය විසිනි. ඇමති අහලය විසින් වඩමණක අහලවි වැවෙහි ජලයෙහි ආදායම භික්ෂු සංඝයාට ප්‍රදානය කර තිබේ. මෙම ප්‍රදානය සිදු කිරීමේ දී ඔහු ප්‍රධාන කාරණා දෙකක් පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කර තිබේ. දකපති ආදායම විහාර භුක්තියට ප්‍රදානය කිරීමේ දී ඔහු විසින් විහාරය සඳහා අයිතිය නොකඩවා පවත්නා පරිද්දෙන් ප්‍රදානය කිරීමට වග බලාගෙන තිබේ. අනෙක් විශේෂ කාරණය නම් ඒ බව අන් අයට දැන ගැනීමට සළස්වා තිබීම ය. මෙහි සඳහන් වන "'අකඩ තනහි ගණවය' යනුවෙන් ප්‍රකාශ කිරීම මගින් මින් පෙර විහාර භුක්තිය සඳහා ප්‍රදානය කරන ලද කුඹුරු, වැව්, ඉඩම් බදු අනෙක් පාලකයාගේ කාලය වනවිට විහාර භුක්තියෙන් ඈත්ව යන ස්වභාවයක් උද්ගතව පැවති බව පැහැදිලි වේ. එසේ සිදු නොවී අඛණ්ඩව විහාර අයිතියෙහි පවත්නා පරිද්දෙන් ප්‍රදානය සිදු කිරීමට ඇමති අහලය විසින් උත්සාහ ගෙන තිබේ. එසේ ම ඒ තත්ත්වය වඩාත් ස්ථාවරව පවත්වාගෙන යාම උදෙසා ඒ සම්බන්ධ ව මහජනයා දැනුවත් කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීමට ද ඇමති පියවර ගෙන තිබේ. ඒ තුළින් විහාර අයිතියෙහි පවත්නා වඩමණක අහලවි වැවෙහි දකපති ආදායමට කිසිවකුට හෝ මැදිහත් වීමක් සිදු කිරීමේ හැකියාව අහුරා තිබේ. එසේ ම මෙම ලිපියේ සඳහන් ආකාරයට නාග මහරජු විසින් වඩමණක අහලවි වැවෙහි බොජකපති ආදායම පයගලක අහලි පවත විහාරයෙහි මුළුතැන්ගෙයට ලැබීමට සළස්වා තිබේ. ඊට අමතරව එම බොජකපති ආදායමෙහි අගය හෙවත් වටිනාකම බෝධිඝරය සඳහා ද, උපෝසථාගාරය සඳහා ද, චෛත්‍යඝරයෙහි පිළිසකර කිරීමේ කටයුතු සඳහා ද ප්‍රදානය කර තිබේ. ලිපියේ තවදුරටත් සඳහන් කරන පරිදි 'බෝධි අගනක වැව' ගෙන එකී විහාරයේ භික්ෂු සංඝයා හට ම ප්‍රදානය කර ඇත. "ගණිය" යනුවෙන් සඳහන් කර තිබීමෙන් එම වැව රජුගේ අයිතියෙහි නොපැවති බවත්, කිසියම් මිළ දී ගැනීමක් සිදු ව ඇති බවත් තහවුරු වේ. එහෙත් එම මිළ දී ගැනීම පිළිබඳ ව කිසිඳු තොරතුරක් ලිපියෙන් හෙළිදරව් වන්නේ නැත. බෝධි අගනක වැව ප්‍රදානය කළ බව දැක්වීමෙන් වැවේ සියලු ම ආදායම් භික්ෂූන් සන්තක කිරීමක් සිදුව ඇති බව හෙළිදරව් වේ.

අංක 86 දරණ රුවන්වැලි සෑය ලිපිය (Ruwanwaliseya Inscription, Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) වැව් ඉඩම් බදු සම්බන්ධයෙන් වැදගත් තොරතුරු රැසක් හෙළිදරව් කරයි. මහා සිව තෙරුන්ගේ සොහොයුරා වූ බෝධි විසින් රුවන්වැලිසෑයට සිදු කරන ලද ප්‍රදානයක් පිළිබඳව දක්වා තිබේ. එම ප්‍රදානයන් අතර මජුතගම නකරියහි මතෙරහි මතක නම් වූ වැවෙහි මතෙර මජිබක ද, වවිගොනක හෙවත් වැව ආශ්‍රිත තණ බිම ද, වවිතනි හෙවත් වැව් පිටිය ද, අවරණ හෙවත් වේල්ල ද, අවරණතනි හෙවත් වේල්ල ආශ්‍රිත පිටිය ද, අටකරික අරබ හෙවත් අටකරිසයක් වූ උයන් බිම් ප්‍රමාණය ද වේ. පියා සන්තක කොටස් උරුමයෙන් හිමි වූ විට බෝධි කුමාරයා විසින් මහා ථූපයෙහි පූජා වියදම් සඳහා ප්‍රදානය කිරීමක් සිදුකර ඇත. ප්‍රදානයේ ස්වභාවය දෙස බලන විට වැවේ ප්‍රධාන ආදායම් කොටස් සියල්ල විහාර භුක්තිය උදෙසා ලබා දීමක් සිදුකර ඇති බව පැහැදිලි වේ. මෙසේ සියලු ආදායම් කොටස් රුවන්වැලිසෑය සඳහා පරිත්‍යාග වන්නට ඇත්තේ එකී විහාරයෙහි පූජා කටයුතු සඳහා විශාල වියදමක් සමකාලීන සමය වනවිට යොදවන්නට සිදුවීම නිසා බැව් කල්පනා කළ හැකි ය. "මෙම දීමනාවට සම්බන්ධ ලේඛනය හෙවත් තල්පත ලෝහ ප්‍රාසාදයෙහි භාණ්ඩාගාරයෙහි තබන ලදී" යනුවෙන් සඳහන්කර තිබීමෙන් ප්‍රදානයෙහි සුරක්ෂිතතාව පිළිබඳ ව ප්‍රමාණවත් අවධානයක් යොමුකර ඇති බවත්, එකී ප්‍රදානයට අවහිරයක් සිදු කිරීමට කිසිවකුට ඉඩ ප්‍රස්ථා නැති බවත් තහවුරු කර දී ඇත.

අනුරාධපුර කෞතුකාගාරයෙහි තබා ඇති අංක 94 දරණ ලිපියෙහි 'සිධ මහවිලබනක දෙවබ අමෙත මෙලයහ පුත මහ මතයහ ච මෙහ මල චුමතයහ ච මෙ තිජන... සහ සහස ච අන සත සතෙච අනෙ සෙ සටිච මෙ වතක කෙහෙවන දරිය දෙවගම අතනෙහි පදහතරක වවිය මතෙර මජිබක සවය ගනිය විලෙබන දෙවබ (අමෙත) දෙවරබක විහරහ පකෙවට කොට දිනෙ අමෙත මහවිලබනක දෙවබ සිටි මත කලයහට ප(ච සහ) කහවණ දරිය උපලව බිජිකහි හක නකරක (වවිය) මතෙර මජිබක සවය ගනිය දෙවරබක විහරහි තෙල හුත මුල කොටු දිනෙ පුවය මළි තිස මහරජහ' (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) දැක්වෙන ආකාරයට දෙවබ නම් ඇමතිවරයාත්, ඔහුගේ පුත් වූ මහමතයත්, මහමතයගේ සොහොයුරු චුමතයත් යන තිදෙනා විසින් දෙවගම වෙළඳ ආයතනයෙහි පිහිටි පද හතරක වැවෙහි මතර මජිබක ආදායම් සියල්ල මිළ දී ගන්නේ කහවණු 100766 ක් කහවණු වැයකොට ය. (සහ සහස ච අන සත සතෙච අනෙ සෙ සටි ච) මතෙර මජිබක යනු වැව් සහ ඇළවලින් අල්ලන ලද මසුන් වෙනුවෙන් අය කළ බද්ද බව පෙර සඳහන් කෙරිණි. ඒ අනුව මෙම තිදෙනාට පදහතරක වැවෙහි මත්ස්‍ය බද්ද ලබා ගැනීමට කහවණු 100766 ක් වැය කිරීමට සිදු වී තිබේ. එය සමකාලීන සමාජය වනවිට විශාල මුදල් ප්‍රමාණයක් බව පැහැදිලි ය. මෙම ශිලා ලිපියට අනුව වැවෙහි ආදායම් මාර්ග විකිණීමෙහි පැවති හැකියාවත්, ඒවා මිළයට ගැනීමට තිබූ හැකියාවත් පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ගොඩනගා ගත හැකි ය. දෙවබ ඇමති විසින් මෙකී මිළ දී ගැනීමෙන් තමන් සතු කරගත් සියලු ආදායම් පරිත්‍යාග කරන්නේ දෙවබරක විහාරයෙහි මුළුතැන්ගෙයි වියදම් සඳහා ය. ලිපියෙහි 6-10 අතර පේළිවල සඳහන් කරන ආකාරයට දෙවබ ඇමති විසින් උපලව බිජකයෙහි හක නකරක වැවෙහි මතෙර මජිබක ආදායම් සියල්ල ම තම අයිතියට පවරා ගන්නේ කහවණු පන්දහසක් වැයකොට ය.

එම මිළ දී ගැනීම සිදුව ඇත්තේ මත කලහය නම් පුද්ගලයාගෙනි. ඒ අනුව සමකාලීන සමාජයේ එක් එක් පුද්ගලයන් අත පැවති ඉඩම් අයිතියත්, ඇමති වරුන්ට පවා ඇතැම්විට ඒවා මිළ දී ගැනීමට සිදු වූ ආකාරයත් පිළිබඳ ව පැහැදිලි අදහසක් ගොඩනගා ගත හැකි ය. ලිපියේ දක්වන ආකාරයට හකනකරක වැවෙහි මත්ස්‍ය බද්ද තමා සතුකර ගන්නේ කහවණු පන්දහසක් වැය කිරීමෙනි. දෙවබ ඇමති හට පදහතරක වැවෙහි මතෙර මජිබක ආදායම මිළ දී ගැනීමට කහවණු 100766 ක් වැය කිරීමට සිදු විය. ඒ අනුව සමකාලීන සමාජය වනවිට වැව් ඉඩම්වල මිළ ගණන් නිශ්චය කිරීමේ හැකියාව ද තීරණය කළ හැකි ය. හකනකරක වැවේ මත්ස්‍ය බද්ද කහවණු පන්දහසක් දී මිළ දී ගත්තා යැයි කීමෙන් එහි මත්ස්‍ය බද්දෙහි ආදායම පද හතරක වැවෙහි ආදායමට සාපේක්ෂව 20/1 ක ප්‍රමාණයක් වන්නට ඇති බව පැහැදිලි වේ. මෙකී ආදායම පූජා කෙරෙන්නේ දෙවබරක විහාරයෙහි තෙල් සහ පූජා වියදම් සඳහා ය.

අංක 99 දරණ හබරණ ලිපියෙහි ද (Habarana Inscription, Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) පුරාණ වැව් ඉඩම් බදු ක්‍රම පිළිබඳව තොරතුරු රැසක් හෙළිදරව් කරයි. ලිපියේ සඳහන් ආකාරයට මපරුමක මහ රජ විසින් අගිවඩමක වැවෙහි බොජකපති ආදායම සේනගේ පුත් වූ අබලයටත්, ජ්‍යෙෂ්ඨ ආරක්ෂක හටයකු වූ නකයගේ මුණුබුරු වූ වෙසමනයටත් ප්‍රදානය කර තිබේ. එම ප්‍රදානයෙන් ඔවුන්ට ලැබෙන මුදලින් දකපති ආදායමට අදාළ කුල අමන බද්ද ගෙවීමට යොදා ගත හැකිවන සේ සළස්වා වැව සංඝයා සතු වැවක් සේ ලේඛනගත කිරීමක් පිළිබඳ ව ලිපියේ පෙළෙහි සඳහන් කර තිබේ. ඒ අනුව දකපති ආදායම පමණක් ප්‍රදානය ලත් පාර්ශ්වයන්ට පවරා වැවෙහි අයිතිය විහාරය වෙත පවරා දීමක් සිදු වී ඇති බව පැහැදිලි වේ. තව ද වැවේ බොජකපති ආදායමට ගෙවිය යුතු බදු අවලංගු කොට චේතියගිරි විහාරයෙහි අම්බත්ථලයෙහි සිලා චේතියෙහි චේතියඝරයෙහි තෙල් සහ පූජා වියදම් සඳහා ද, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ද, ඉතිරිය ගෙන මෙම චේතියඝරයෙහි පිළිසකර කටයුතුවල නිරතවන සංඝයා වහන්සේට ආහාර සැපයීමට මුළුතැන්ගෙයි වියදම් සඳහා ද ලබා දුන් බවක් සඳහන් කරයි. ඒ අනුව බොජකපති ආදායම් බදු අවලංගු කොට විහාර භුක්තියෙහි පැවරීමේ දී නිශ්චිත වශයෙන් කළ යුතු කාර්යයභාරය වෙන්කොට දක්වා තිබීම සුවිශේෂී කරුණක් වේ. විහාර භුක්තිය සතු වූ වැවෙහි බොජකපති ආදායමෙන් ඉන් පරිබාහිර කාර්යයක් සිදු කිරීමේ හැකියාව මේ මගින් අවහිර කොට තිබේ. අංක 100 දරණ දක්ඛිණ ථූපවිහාර ලිපියෙහි ද (Dhakkhina Thupavihara Inscription, Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) මෙවැනි ම බොජකපති ප්‍රදානයක් පිළිබඳ ව දක්වා තිබේ. එකී ලිපියට අනුව මහා පරුමක පිත මහරජ විසින් බොජකපති ආදායම ගෙවිය යුතු බදු අවලංගු කොට දක්ඛිණ ථූප විහාරයට පවරා දෙන්නේ තිස්ස මහා චෛත්‍යයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහාත්, තෙල් සහ පූජා වියදම් සඳහාත්, සෙසු ඉතිරිය මහා මුළුතැන්ගෙයෙහි වියදම් සඳහාත් ය.

අංක 159 දරණ මෝලාහිටියවෙලේගල ලිපියෙහි ද 'සිධම් සෙන පුත වහබයෙ ක (ටෙල) වසක වවි ච අහුරවිකි ච විල පවතෙහි අති සිමිය ගණවය තුම හ අසනක දකපතිය කරිහ අම්ණිය බක බිකු සගහටය දිනි...' (Molahitiyawelegala Inscription, Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) වැවක දකපතිය භික්ෂු සංඝයාට පිදීමක් පිළිබඳ ව සඳහන් වේ. ලිපියේ සඳහන් ආකාරයට වසභ විසින් කටෙල වසික වැව ද, අහුරවි වැව ද, පිලපවත විහාරය සතු දේපළක් ලෙස දක්වා තිබේ. ලිපියේ සඳහන් පරිදි රජුගේ දකපති ආදායම කුඹුරු කරීසයකට අමුණක් බැගිනි. කුඹුරු සඳහා වැව් ජලය ලබා ගැනීමේ දී එකී ජලයෙන් අස්වද්දන කුඹුරු කරීස්සකට අමුණු 01 බැගින් ජල බද්ද වශයෙන් ගෙවීමට සිදු වූ බව මින් අනාවරණය වේ. කරීසයක් යනු අමුණු 04 කි. අමුණක් අක්කර 2-2 2/1 ක් වේ. ඒ අනුව අමුණු හතරකට අමුණක් වශයෙන් එනම් 4/1 ක් වශයෙන් බදු ගෙවීමට සිදු වී ඇති ආකාරය අවබෝධ කර ගත හැකි ය. මිහින්තලේ මහා සෑයට පහළින් ගලක කොටා ඇති ලිපියක "වවහි දකපති චතර බකහි එක බග" යනුවෙන් වැවේ ජල ආදායමෙහි කොටස් හතරෙන් එක කොටසක් චේතියගිරි මහා විහාරයට ප්‍රදානය කළ යුතු බව දක්වා තිබේ. මෙහි 4/1 ක් යනු කුමන ප්‍රමාණයක් ද යන්න නිශ්චිතව දක්වා නැත. 4/1 ක් වශයෙන් ජල බදු අය කිරීම සාමාන්‍ය සම්ප්‍රදාය වූ බව පෙනේ.

වැව් සහ කුඹුරු අතර ජල ප්‍රවාහනයට සම්බන්ධව අය කරගන්නා ලද බදු වර්ග කිහිපයක් පිළිබඳව ද අභිලේඛන මූලාශ්‍රය මගින් හෙළිදරව් වේ. බීජ වපුරා පැලවන කාලයේ දී ඇළවල් මගින් වැව්වල සිට කුඹුරුවලට සපයන ලද ජලය පැමිණීම පාලනයක් සහිතව කළ යුතු වූ බවත්, එසේ වැව් ජලය පාලනයක් සහිතව සැපයීම සඳහා වැව් සහ ඇළවල් හිමියන්ට කුඹුරු හිමියන් විසින් ගෙවිය යුතු 'පිටලි' නමින් හැඳින් වූ බද්දක් පිළිබඳ ව සෙනරත් පරණවිතාන ශූරීන් අදහස් දක්වයි (Inscriptions of Ceylon, Vol. II Part I, 1983). ජලය අත්‍යවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර කුඹුරට පැමිණියහොත් බීජ විනාශ වී යා හැකි නිසා එය නිසියාකාරව කළමනාකරණය කිරීමට මෙවන් බද්දක් අය කරන්නට ඇති බව පරණවිතාන ශූරීන් වැඩිදුරටත් පෙන්වා දේ (Inscriptions of Ceylon, Vol. II Part I, 1983). සිනඩියගල ලිපියේ (Sinadiyagala Inscription, Inscriptions of Ceylon, Vol. II Part I, 1983).දැක්වෙන සඳහන මෙවන් අදහසක් ප්‍රකාශ කිරීමට මුල් වී තිබේ. 'මගණ නගරයෙහි පවුල් පනහක් ගෙන පිටලි බද්ද වශයෙන් එම පවුල් පනහ විසින් මාසක දෙසීයක් දියයුතු සේ නියම කොට' යන අරුත එහි ගැබ්ව පවතී. ලිපියේ සඳහන්

ආකාරයට මෙම කාර්යය වෙනුවෙන් පවුල් පනහ ගෙවිය යුතු සාමූහික බද්ද මාසක දෙසීයකි. එකී බද්ද අය කරන ලද්දේ මසකට ද, කන්නයකට ද, වසරකට ද යන්න පැහැදිලිව දක්වා නැත.

මිහින්තලේ අංක 117 දරණ ශිලා ලිපියෙහි (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) එන 'පිඩමහනක'නම් වචනය පිළිබඳ ව අර්ථ දක්වන සෙනරත් පරණවිතාන මහතා 'පිඩමහනක' යනු වැවකින් ජලය පිටවන පිටවාන හැඳින්වීමට යෙදුණු පැරණි වචනයක් බව දක්වා තිබේ (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) මෙහි සඳහන් ආකාරයට මහිදල වැවේ පිටවාන සහ මලඩගණ නමැති ස්ථානයෙහි පිහිටි නක වැවෙහි පිටවාන අසල පිහිටි සියලු කුඹුරුකරීස වලට සැපයුන ජලයට ලැබෙන අදායම සහ ජවක කුඹුරට සපයන ලද සියලු ජලයට ලැබෙන ආදායම චෛතියගිරි විහාරයට පරිත්‍යාග කර තිබේ. රස්නකෑව ලිපියෙහි (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) සඳහන් වන 'පිඩරි' යන වචනය ද සිනඞියගල ලිපියේ සඳහන් වූ 'පිටලි' යන්නට සමාන ස්වරූපයෙන් යෙදී තිබේ (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) ඒ අනුව පිඩරි, පිටලි, පිඩලි යනු වැව්වලින් ඇළවල් හරහා කුඹුරුවලට සපයන ලද ජලය වෙනුවෙන් අය කළ ගාස්තුවක් ලෙස කල්පනා කළහොත් මෙම බද්ද බොහෝ ශිලා ලිපිවල එන 'දකපති' යන්නට සමාන වන්නක් බව කල්පනා කළ හැකි ය. රස්නකෑව ලිපියෙහි පෙළෙහි දැක්වෙන ආකාරයට තොජනහින කෙතට එක් අස්වනු කාලයක් සඳහා වැවෙහි පිට ඇළෙන් සපයන ලද ජලයට ගෙවිය යුතු වූ ගාස්තුව වන කරීසයක් චෛත්‍යයට පූජා කරන ලදී. මෙහි සඳහන්වන කරීසය ඇතැම්විට කරිසයක කුඹුරු ප්‍රමාණය හෝ කරිසයක අස්වනු ප්‍රමාණය විය හැකි ය. කරිසයක් යනු දළ වශයෙන් අමුණු හතරක වපසරියකට සමාන ය (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001). අමුණු එකක් අක්කර දෙකක් දෙකහමාරක් අතර ප්‍රමාණයකි. ඒ අනුව ගෙන සළකා බලතොත් මෙහි කරීසයක් යනු දළ වශයෙන් අක්කර 8-10ක් අතර ප්‍රමාණයකි. මෙම ප්‍රමාණය ගෙවන්නේ එක් කන්නයකට වැවෙහි පිට ඇළෙන් සැපයෙන ජලය වෙනුවෙනි. එකී ප්‍රමාණය ගෙවීමට කුඹුර භුක්ති විඳින්නා අනිවාර්යයෙන් බැඳී සිටී.

අංක 121 දරණ දෙව්රම්වෙහෙර ශිලා ලිපියේ (Dewramvehera Inscription, Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) එන 'පිටමණය බක' යන වචනය පිළිබඳ ව පරණවිතාන මහතා ගෙන එන අදහස ද වැව් හා බැඳි ඉඩම් සම්බන්ධයෙන් වැදගත් වේ. මේ පිළිබඳ ව සිය අදහස ගෙන එන පරණවිතාන ශූරීන් 'කරමක කරිහ' නමැති කුඹුරෙහි වැපිරූ බීජ පිටකයක එනම් ප්‍රමාණය වෙනුවෙන් ආපසු ලැබෙන ආදායම් කොටස වූ අමුණක ප්‍රමාණය 'පලචවථ' විහාරයට ප්‍රදානය කරන ලද බව' දක්වා තිබේ. 'පිටමණය බක' යන වචනයෙහි 'පිට' යන්න විස්තර කරන පරණවිතාන ශූරීන් පිට - පෙකඩ- පෑල වශයෙන් එය විකාශය වූ බව දක්වයි (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001). ඒ අනුව වැපිරූ බීජ පිටකයක එනම් පෑලක ප්‍රමාණය සඳහා අමුණක් බැගින් ආපසු ලැබෙන ආදායම් කොටස 'පිටමණය බක' වන බව ඔහුගේ අදහසයි. එහෙත් 'පිටමණය බක' යන්න පිට ඇළෙන් 'කරමර කරිහ' නමැති කුඹුරට ලැබෙන ජලය සඳහා ගෙවිය යුතු ගාස්තුව වන කරිසයක ප්‍රමාණය 'පලච වථ' විහාරයට ප්‍රදානය කළ බව ද අර්ථ ගැන්විය හැකි ය.

**වැවෙහි ආදායම් කොටස් විහාර සන්තක කිරීමේ සම්ප්‍රදාය හා කළමනාකරණය**

ලජක රජ විසින් අබල කෙත වැව මිලට ගෙන කුබිලවි තිස පවත විහාරයට ප්‍රදානය කිරීමක් පිළිබඳ ව බක්කිඇළ ශිලා ලිපියෙහි සඳහන් වේ. 'ලජක තිස මහරජ අබ (ල) කෙතවි කනවය කුබිලවි තිස පවත හ දිනි. මෙහි දකපතියහි (තිණි බකහි බක බක) තිස මහරජ (දිනෙ) කුබිලවි තිස පවත විහරහි' (Epigraphia Zeylanica, Vol. I, 1994). පෙළෙහි සඳහන් ආකාරයට ලජක තිස මහරජ විසින් අබල කෙත වැව මිලට ගෙන කුබිලවි තිස පවත විහාරයට පූජා කර ඇත. මෙහි දකපති ආදායමෙහි කොටස් තුනෙන් එක කොටසක් තිස්ස මහ රජු විසින් කුබිලවි තිස පවත විහාරයට ප්‍රදානය කරන ලදී. මෙහි සඳහන් 'තිණපති' යන්න විමර්ශනය කළ යුතු ය. තිඹිරිවැව ලිපියේ ද (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001 ) 'තිණපතිය වවිය' යන්න සඳහන් වන අතර මේ පිළිබඳ ව සිය අදහස ගෙන එන සෙනරත් පරණවිතානයන් 'ආදායම් වර්ග තුනක් සහිත වැව' යනුවෙන් පරිවර්තනය කරයි (එම). එම ආදායම් වර්ග තුන 'බොජකපති, දකපති සහ මතෙර මජිබක' යන ආදායම් බව හෙතෙම වැඩිදුරටත් සඳහන් කරයි. තිඹිරිවැව ලිපියෙහි එන 'තිණපතිය වවිය' යන්න අර්ථ දැක්වීමේ දී පරණවිතාන මහතා ඉහත අර්ථකථනයට අමතරව තවත් අර්ථකථනයක් ද ඉදිරිපත් කර තිබේ. එනම් 'පති' යනු 'අදායම් කොටස' ලෙස ගෙන සාකච්ඡා කිරීමයි. එවිට වැවක් සහ එම වැව පහළින් වූ කුඹුරු යායෙහි හිමිකම කොටස් තුනකට බෙදා 'තිණපතිය වවිය' යනුවෙන් අදහස් කරන්නට ඇති බව ඔහුගේ අදහසයි. 'පති' (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) (ආදායම් කොටස/කොටස්), 'දොපති' (බෙනිල්, 2015) (ආදායම් කොටස් දෙක), 'තිණිපති' (බෙනිල්, 2015) (ආදායම් කොටස් තුන), 'චතරපතිය' (බෙනිල්, 2015) ('චතුබකපතිය' (බෙනිල්, 2015) (ආදායම් කොටස් හතර), 'මහපතික' (බෙනිල්, 2015) (මහා ආදායම් කොටස), 'දස කොටසහි එක කොටසක' (බෙනිල්, 2015) (කොටස් දහයකින් එක කොටසක්), 'දොදස කොටසහි එක කොටසක' (බෙනිල්, 2015) (කොටස් දොළසකින් එක කොටසක්) ලෙස සඳහන් වන අවස්ථා අභිලේඛන මූලාශ්‍රයවලින් දත හැකි ය. මෙම සඳහන්වලින් පෙනෙන්නේ වැවේ විවිධ

කොටස්වලට බෙදී ගිය ආදායම්වලින් ඒවායෙහි කොටස් හිමිකරුවන් විසින් තමන්ට ලැබිය යුතු ආදායම් කොටස් හිමි කරගත් බවයි.

අංක 101 දරණ පුවරසන්කුලම ලිපියෙහි (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) වැවක 'පති' නමැති ආදායම් කොටස විහාරයකට පූජා කිරීමක් පිළිබඳ ව සඳහන් කර තිබේ. මෙම ශිලා ලිපියට අනුව රමනයක මහරජු විසින් අභයගිරි විහාරයට අනුබද්ධ අනුළ තිස්ස පබ්බත විහාරයට වැව් සහ කුඹුරු රාශියකින් ඔහුට හිමි ආදායම් කොටස (පති) පිදූ බව සඳහන් කරයි. තාමරගල ලිපියෙහි ද '...පහණ විය (එකෙපති) (බිකු ස) ගහට දින ගුත පවත විහරහි...' (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) පහණවිය වැවෙහි එක කොටසක (එකෙපති) ආදායම ගුප්ත පබ්බත විහාරයෙහි භික්ෂු සංඝයාට ප්‍රදානය කරන ලද බව දැක්වේ. වාරි ක්‍රම ප්‍රදානයේ දී අදාළ වැවෙහි 'දොපති' එනම් ආදායම් කොටස් දෙක විහාරවලට ප්‍රදානය කරන ලද අවස්ථාවන් පිළිබඳ ව අභිලේඛන මූලාශ්‍රය මගින් පැන නැගේ. දූවේගල ශිලා ලිපියෙහි (Inscriptions of Ceylon, Vol. II, Part I, 1983) දක්වන්නේ වැවක ආදායම් කොටස් දෙකක් විහාරයකට පරිත්‍යාග කිරීමක් පිළිබඳව ය. '(ව) කර (විය) විහරවිය පනිතකවිය ච නිකුලවිලක ච කළහ (න) කර අළි (චෙ) දොපති මෙ විහරහි දිනෙ' වකරවිය, විහරවිය, පනිතකවිය ද, නිකුලවිලක ද, කළහනකර ඇළ ද යනාදියෙහි ආදායම් වර්ග දෙක (දොපති) එසේ විහාරයට පූජා වී තිබේ. සෙනරත් පරණවිතානයන්ගේ නිර්වචනයට අනුව 'දොපති' යන්න 'ආදායම් වර්ග දෙක' ලෙස දක්වා තිබේ (Inscriptions of Ceylon, Vol. II, Part I, 1983). එම ආදායම් වර්ග දෙක කෙබඳු ආදායම් දැයි පරණවිතානයන් විසින් පැහැදිලිව අර්ථ ගන්වා නැත. ආචාර්ය ලක්ෂ්මන් එස්. පෙරේරා මහතා ද 'දොපති' යන්න අර්ථකථනය කර ඇත්තේ 'දකපතිය' සහ 'බොජකපතිය' යනුවෙනි (Perera, 2001). එහෙත් පරණවිතානයන් සහ ලක්ෂ්මන් එස්. පෙරේරා මහතා විසින් සිදු කරන මෙම අර්ථකථනයන්ට නිශ්චිත නිගමනයක් දෙන්නට තරම් ස්ථිර තොරතුරු අභිලේඛන මගින් හෙළිදරව් නොවන බව ද සඳහන් කළ යුතු ය. යට සඳහන් කළ පරිදි පරණවිතාන මහතා ද 'දොපති' යන්න වරෙක ආදායම් වර්ග දෙක යනුවෙනුත්, තවත් වරෙක 'දකපති' සහ 'බොජකපති' වශයෙනුත් දක්වා ඇති බව කිව යුතු ය. දූවේගල ලිපියෙහි සඳහන් වන වකරවිය, විහරවිය සහ පනිතකවිය වැව් වශයෙන් ද, නිකුලවිලක විලක් වශයෙන් ද, කළහනකර ඇළක් වශයෙන් ද පරණවිතාන මහතා විසින් පරිවර්තනය කොට තිබේ.

මිහින්තලේ කණ්ඨක චෛතිය ලිපිය (Inscriptions of Ceylon, Vol. II, Part I, 1983) තවත් එවැනි ම 'දොපති' ප්‍රදානයක් පිළිබඳ ව සඳහන් කරයි. දෙවානම්පියතිස්ස මහරජ විසින් කණ්ඨක චෛතිය වෙත 'කබවිකහි' ආදායම් වර්ග දෙක (දොපති) දෙන ලද බවත්, නාගමහරජ විසින් 'බලයත ගමකවහි' ආදායම් වර්ග දෙක (දොපති) මිලට ගෙන ප්‍රදානය කරන ලද බවත් ශිලා ලිපියේ දක්වා තිබේ. මෙහි සඳහන් 'කබවික' සහ 'බලයත ගමකවහි' යනු දෙක ම වැව් වන බව පරණවිතානයන්ගේ අදහසයි. නාගමහරජ විසින් 'බලයත ගමකවහි' ආදායම් වර්ග දෙක මිලයට ගෙන ප්‍රදානය කළා යැයි දැක්වීමෙන් සමකාලීන යුගයේ රජු යටතේ මෙන් ම සෙසු පුද්ගලයන් අත ද ඉඩම් අයිතිය පැවරී ඇති බවක් අවබෝධ කර ගත හැකි ය. කදුරුවැව ලිපියේ ද (Inscriptions of Ceylon, Vol. II, Part I, 1983) වැව් හා බැඳි 'දොපති' ප්‍රදානයක් පිළිබඳව විස්තර වේ. 'වවි දතවිකහි දොපති ධනෙ කරජවිකහි දොපති දනෙ' දතවික වැවෙහි ආදායම් වර්ග දෙකක්, කරජවිකහි ආදායම් වර්ග දෙකත් ප්‍රදානය කළ බව දක්වා තිබේ. මෙහි සඳහන් 'දතවික' යනු වැවක් ලෙස ස්ථිරව ම සඳහන් කරන සෙනරත් පරණවිතානයන් 'කරජවික' යනු වැවක්, කුඹුරක් හෝ වෙනත් දේපළක් ද යන්න ස්ථිරව ම සඳහන් කර නැත.

අභයගිරි සලපතල මළුවේ ඇති ලිපියෙහි (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) අභය වැවෙහි කරීස දොළහක් ද, ආදායම් වර්ග දෙක ද පූජා කිරීමක් පිළිබඳ ව සඳහන් කරයි. මෙහි එන 'දොපති' යන්න 'දකපති' සහ 'බොජකපති' යන ආදායම් වීමේ හැකියාවක් ඇති බව පරණවිතානයන්ගේ මතය යි. ලයින්මලේ ලිපියෙහි (Inscriptions of Ceylon, Vol. II, Part I, 1983) දැක්වෙන සඳහන ද 'දොපති' ප්‍රදාන සම්බන්ධයෙන් සුවිශේෂී වේ. '...(ගිරි) ගම වවි ච මල කෙතක ච චොරවිය ච මෙ තිණි තනහි දොපතිය කර කඩය දිනි සිපවත විහරහි බිකු සගහට මහ පකවටහි දිනි' පෙළෙහි සඳහන් ආකාරයට ගිරිගම වැව ද, මල කෙත ද, චොරවිය ද මෙම තුන් තැනෙහි ආදායම් වර්ග දෙක එම ආදායම් වර්ග දෙක සඳහා ගෙවිය යුතු බදු මුදල අවලංගු කොට සිපවත විහාරයෙහි භික්ෂු සංඝයා හට මුළුතැන් ගෙයි වියදම් සඳහා පරිත්‍යාග කොට තිබේ. මෙහි එන 'මලකෙතක' යනු 'කෙතක්' වශයෙන් ද, 'චොරවිය' යනු 'වැවක්' වශයෙන් ද පරණවිතානයන් අරුත් ගන්වා තිබේ. ලිපියේ සඳහන් ආකාරයට ගිරිගම වැවේ ද, මල කෙතෙහි ද, චොරවියේ ද ආදායම් වර්ග දෙක පවරා දෙන්නේ එම ආදායම් සඳහා ගෙවිය යුතු බදු මුදල අවලංගු කිරීමෙන් පසුව ය. මෙකී ප්‍රදානයෙන් පසුව එකී ආදායම් කිසිඳු බදු නීතියකට යටත් නොවී භුක්ති විඳීමේ හැකියාවක් අදාළ විහාරය සතු කර තිබේ. එයින් හෙළිදරව් වන අනෙකුත් කාරණය නම් විහාරයකට හිමි වූ මෙම වරප්‍රසාදය සෙසු භුක්තිකරුවන්ට හිමි නොවූ ආකාරයකි. ආගමික ආයතනයක් හැර සෙසු ආයතනයක් හෝ පුද්ගලයකු මෙකී 'දොපති' හෙවත් ආදායම් භුක්ති විඳීමේ දී කිසියම් බදු මුදලකට යටත්ව එම භුක්ති විඳීම සිදුකර ඇති බව පැහැදිලි වේ. අනෙක් වැදගත් කාරණය නම් මෙම ප්‍රදානය සිදු කිරීමේ දී එම ආදායම් වර්ග දෙකෙන් කළ යුතු කාර්යය පිළිබඳව නිශ්චිතව

සඳහන් කර තිබීමයි. ලිපියේ පෙළෙහි සඳහන් ආකාරයට ආදායම් වර්ග දෙක යොදාගත හැක්කේ සිපවත විහාරයෙහි මුළුතැන්ගෙයි වියදම් සඳහා ය. ඉන් පරිබාහිර කාර්යයක නියුතු වීමට අවසරයක් හිමි වන්නට නැත. කරදහෙළ ලිපියෙහි ද (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) 'අසය' විසින් 'ගබ්ඩතතිරි' වැව මිලට ගෙන හබුතගල විහාරයට ප්‍රදානය කිරීමක් පිළිබඳවත්, දොහුලිය වැවෙහි ආදායම් වර්ග දෙක ප්‍රදානය කිරීමක් පිළිබඳවත් සඳහන් වේ. මැටියංගනේ ලිපියෙහි ද (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) 'සිලවියහි යකති දොපති බිකු සගහ අසති' යනුවෙන් 'සිලවියහි ආදායම් වර්ග දෙකෙන් ලැබෙන කුමන හෝ ආදායමක් භික්ෂු සංඝයා සතු ය' යනුවෙන් දක්වා තිබේ.

පෙර සඳහන් කරන ලද වැව් ප්‍රදානයන් හා බැඳි 'ආදායම් කොටස් තුන' හෙවත් 'තිණපති' ප්‍රදානයන් පිළිබඳ ව අභිලේඛන මූලාශ්‍රය රැසකින් තොරතුරු පැන නැගේ. තිස්ස උපරජ විසින් රජකොලක වැවෙහි ප්‍රදාන ආදායම් කොටස් තුනෙන් එක කොටසක් සංඝයාට ප්‍රදානය කරන ලද බව අලුත් හල්මිල්ලෑව ලිපියෙහි (Inscriptions of Ceylon, Vol. II, Part I, 1983) දක්වා තිබේ. ලිපියෙහි එන "රජ කොලක වවිය තිණි මහපති එකපති සගිකෙ" යන සඳහන අර්ථගන්වන සෙනරත් පරණවිතානයන් රජ කොලක වැවෙහි ප්‍රදාන ආදායම් කොටස් තුනෙන් එක කොටසක් සංඝයාට ප්‍රදානය කරන ලද බව දක්වයි. තිඹිරිවැව ලිපියේ ද (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) වැව් ප්‍රදාන හා සම්බන්ධ වන 'තිණපති' ප්‍රදානයක් පිළිබඳ ව දක්වයි. පෙළෙහි දක්වන ආකාරයට ගංගා වාපියෙහි හොම් ය නක ළ ඇමති අබයගිරි විහාරයෙහි සිට ශ්‍රාවණ බෙරය හඬවා වැවෙහි ආදායම් වර්ග තුනෙන් තමා සතු ප්‍රදාන ආදායම් කොටස ප්‍රදානය කළ බවක් සඳහන් කරයි. මෙහි එන 'තිණිපතිය වවිය' යන්න අර්ථ ගන්වන පරණවිතානයන් ආදායම් වර්ග තුන ලෙස බොජකපති, දකපති සහ මතෙර මජිබක ආදායම් බව දක්වා තිබේ. ලිපියේ දක්වන ආකාරයට නකල ඇමති විසින් ප්‍රදානය කරන්නේ වැවෙහි ආදායම් කොටස් තුනෙන් තමා සතුව පවතින ආදායම් කොටසයි. මෙහි සඳහන් ප්‍රදාන ආදායම් මාර්ගය 'බොජකපතිය' විය යුතු බව පරණවිතානයන්ගේ අදහසයි. තිඹිරිවැවෙන් හමු වූ තවත් ලිපියක (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) මෙවැනි ම 'තිණිපති' ප්‍රදානයක් පිළිබඳ ව විස්තරාත්මක ව දක්වා තිබේ. 'සිද්ධම් අමෙතිය මතුල සියරයි ගගවි වවි තිණි මහ ප (ත) ය එක මහපති කති (ණි) කොටසහ කොටු එක කො (ටස) ක (තු) මහ අ සනක ගග පව (ත) වි (හර) හි (බිකු) ස (ගහට) (දි) නෙ.' ලිපියෙහි සඳහන් ආකාරයට ඇමති මතුල සියර විසින් ගගවි වැවෙහි ප්‍රධාන කොටස් තුනෙන් එක ප්‍රධාන කොටසක් යළිත් කොටස් තුනකට වෙන්කොට එයින් තමාට අයත් වූ එක කොටසක් ගංගා පබ්බත විහාරයෙහි භික්ෂු සංඝයා හට ලබා දී තිබේ. වැවෙහි ප්‍රධාන කොටස් තුනෙන් එක ප්‍රධාන කොටසක් ගෙන එය නැවත කොටස් තුනකට බෙදා එයිනුත් එක කොටසක් විහාරයට ප්‍රදාන කිරීම විශේෂ තත්ත්වයකි. මීට හේතු වූයේ කුමක් ද යන්න පිළිබඳ ව ස්ථාවරව යමක් ප්‍රකාශ කළ නොහැකි වුවත් වැවේ ආදායමෙන් ඉතා කුඩා කොටසක් විහාර භුක්තියට පවරා දී ඇති බව පැහැදිලි ය.

වැව්වල 'චතරපතිය' (ආදායම් කොටස් හතර) විහාරයකට පූජා කළ බව සඳහන් වන අභිලේඛන රැසක් ද ක්‍රි.ව. 1වන සියවසින් පසුව දක්නට ලැබේ. ඉපුල් වෙහෙර ශිලා ලිපියේ (Inscriptions of Ceylon, Vol. II, Part I, 1983) '...කබරබවයහ චතර මහපතියහ... විහරහි බිකුසගහටය දිනෙ...' යනුවෙන් කබරබවය වැවෙහි ප්‍රධාන කොටස් හතරෙහි ආදායම විහාරයෙහි භික්ෂු සංඝයා හට ප්‍රදානය කරන ලද බවක් දක්වයි. තාමරගල ශිලා ලිපියේ ද (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) කාන්තාවක විසින් සිදු කරන ලද 'චතරපති' ප්‍රදානයන් පිළිබඳ ව සඳහන් කරයි. ලිපියේ පෙළෙහි සඳහන් ආකාරයට මජිම කුමරුගේ දුවණිය වූ 'වෙමබි' විසින් තමාගේ ධනය වැය කළ පිටනිවිය වැවෙහි කොටස් හතරෙන් එක කොටසක් ද, පහණවිය වැවෙහි එක කොටසක් ද, ගුත්ත පබ්බත විහාරයෙහි භික්ෂු සංඝයා හට ප්‍රදානය කළ බවක් දක්වා තිබේ. මහජනක ඇමති විසින් කබුරක වැවෙහි කොටස් හතරෙන් එක කොටසක් සංඝයා විෂයයෙහි පරිත්‍යාග කිරීම පිළිබඳව ඉලුක්වැව ලිපියේ ද දක්වා තිබේ. රන්දෙනිගම ලිපිය ද (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) වැවක චතරපතිය භික්ෂු සංඝයා විෂයෙහි පිදීමක් සම්බන්ධව තොරතුරු අනාවරණය කරයි. මහපිටගමක නම් ස්ථානයෙහි මහදේව ද විස කඩගුත ද මුදල් ලබා ගෙන අබය වකහි තමන්ගේ කොටස් දෙන ලද බවත්, කඩගුතගේ පුත් වූ සමණ කඩ ගුත වැවෙහි තමන්ට හිමි කොටස් හතර භික්ෂු සංඝයා හට ප්‍රදානය කළ බවත් ලිපියෙහි දැක්වේ. මෙහි එන 'අබයවක' යනු කුමක්දැයි ශිලා ලිපියෙහි සඳහන් නොවෙතත් එය බොහෝදුරට වැවක් විය යුතු බව පරණවිතානයන්ගේ මතය යි (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001).

ලිපියේ දක්වන ආකාරයට වැවෙහි තමන්ට හිමි කොටස් හතර භික්ෂූන් වෙත පිදීම යනුවෙන් මෙහිලා අදහස් වන්නේ වැවේ කොටස් හතරෙහි ආදායම භුක්තියට පැවරීම බව පැහැදිලි ය. සංගප්පොල ලිපියේ ද (Inscriptions of Ceylon, Vol. II, Part II, 2001) අතුලගේ භාර්යාව වූ රද හොනරිවිගමක වැවෙහි කොටස් හතරෙන් එක කොටසක් ගරිමලක විහාරයට ප්‍රදානය කරන ලද බව දක්වයි. කාන්තාවක මෙම ප්‍රදානය සිදු කරන ලද බව දැක්වීමෙන් සමකාලීන සමයේ කාන්තාව සතු වූ ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳව අදහසක් ගොඩනගා ගත හැකි වේ.

## 4. නිගමන සහ නිර්දේශ

රටක සංවර්ධන මිනුම් දඬු අතර මානව ගුණ ධර්ම හා ශික්ෂණය සහිත ජනතාවක් බිහිව සිටීම මූලික තැනක් ගනී. අතීත සංස්කෘතිය තුළ සමාජයේ සෑම ක්‍රියාවලියක් ම විහාරය හා භික්ෂුව සමඟ බැඳී පැවතුණු අතර විහාරය හා නේවාසික භික්ෂූන්ගේ කුදු මහත් අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය පියවර ගැනීම රජුගේ මෙන් ම මහජනතාවගේ ද යුතුකමක් බවට පත් විය. ඒවායේ ආදායම් නේවාසිකයන්ගේ කුදු මහත් අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහාත්, ආගමික කාර්යයන් සාර්ථකව ඉටු කර ගැනීම සඳහාත් මෙන් ම විහාරයේ කැඩුම් බිඳුම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලි සඳහාත් සංවිධානාත්මකව යොදවා ගෙන තිබේ. එම ඉඩම්වල ආදායම් කිසිදු ආකාරයේ අවභාවිතාවකට ලක් වූ බවක් අදාළ යුග තුළ පෙනෙන්නට නොතිබිණි. එකී ඉඩමේ ආදායම නීත්‍යනුකූල ලෙස වෙන් කරන්නේ කුමන කාර්යයක් සාධනය සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ නිසා විහාරස්ථ කළමනාකරණ ක්‍රියාවලිය ද සාර්ථක අන්දමින් පවත්වා ගැනීමට හැකියාව නිර්මාණය වූ බව පැහැදිලිව පෙනෙන්නට ඇත. භික්ෂූන්ගේ ප්‍රත්‍ය පහසුව, විහාරාරාම කැඩුම් බිඳුම් ප්‍රතිසංස්කරණ කටයුතු, විහාරස්ථ පුද පූජා කටයුතු සහ සේවකයන්ගේ වේතන ආදී විහාරාරාම හා සබැඳි ඕනෑම අවශ්‍යතාවක් සඳහා එම ආදායම් යොදවා ගැනීමට හැකියාව පැවති අතර එම ආදායම් නිසි කළමනාකාරීත්වයකින් යුතුව යොදවා ගත් බව ද දැකිය හැකිය. එසේ ම එම ආදායම් යෙදවුණු ආකාරය පිළිබඳ අයවැය වාර්තාවක් වර්ෂාවසානයේ ඉදිරිපත් කිරීම ද අනිවාර්ය කරුණක් බවට පත්ව තිබුණි. එම වාර්තාව සියලු නේවාසිකයන් ඉදිරියේ ඉදිරිපත් කොට භාණ්ඩාගාරික භික්ෂුව සහ විහාරාධිකාරී භික්ෂුව සම්මත කළ පසු එහි විනිවිදභාවය පිළිගැනුණි. එනිසා අතීත ලංකාවේ විහාර සඳහා ප්‍රදානය කරන ලද වැව් ඉඩම් හා ඒවායෙන් ලබා ගත් බදු ක්‍රමවත් කළමනාකරනයකින් යුක්තව විහාර හා විහාර නේවාසිකයන්ගේ අවශ්‍යතා සඳහ යොදවා ගත් නිසා ආගමික සංස්ථාව නිසි පරිදි කළමනාකරණය කිරීමට හැකියාව ලැබුණු බව නිගමනය කළ හැකි ය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අමරවංශ හිමි, කොත්මලේ. (1969). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

කොඩ්රින්ටන්, එච්.ඩබ්. (1938). *ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා ආදායම.* බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන රණවීර. (1993). *සිවුර සහ නඟුල.* කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

*චූලවංස.* (1925). ගයිගර්, විල්හෙල්ම්. (සංස්.). ලන්ඩන්.

*දීඝ නිකාය*, අග්ගඤ්ඤ සූත්‍රය, වෙළුම III (1998). වැලිතර සිරි ඥාණවාස. (සංස්.). කොළඹ: විද්‍යාසාගර මුද්‍රණාලය.

ප්‍රියංක, බෙනිල්. (2015). *ක්‍රිස්තු වර්ෂ 1,2,3, සියවස්හි ලක්දිව සෙල්ලිපි ඇසුරෙන් සකස් කරන ලද දත්ත*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බෂාම්, ඒ. එල්. (1995). *අසිරිමත් ඉන්දියාව.* බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

*මහාවංසය.* (1996). සුමංගල හිමි හා දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (සංස්.). කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

රණවැල්ල,සිරිමල්. (1984). *පුරාතන අර්ථ ක්‍රමය,* මහවැලි වංශය 1 කාණ්ඩය, කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

රණවැල්ල, සිරිමල්. (2003). *පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය.* බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

*ලංකා විශ්විද්‍යාලය ලංකා ඉතිහාසය*, පළමු කාණ්ඩය I, II භාග. (2015). නිකලස් ආටිගල සහ තවත් අය. (සංස්.). වැලිවිටියේ සෝරත හිමි. (සංස්.). කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය.

*ශ්‍රී සුමංගල ශබ්දකෝෂය.* (1999). වැලිවිටියේ සෝරත හිමි. (සංස්.). කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

*සමන්තපාසාදිකාව*, (2003). ධම්මකුසල හිමි, අම්බලන්ගොඩ (පරි.). කොළඹ: ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සංගමය.

Codington, H.W. (1938). *Ancient Land Tenure and Revenue in Ceylon*. Colombo.

*Epigraphia Zeylanica, Vol. I,* (1994). Don Martino de Silva Wickramasinghe. (Ed.). New Delhi: Asian Educational Services.

*Epigraphia Zeylanica, Vol. II.* (1994). Don Martino de Silva Wickramasinghe. (Ed.). New Delhi: Asian Educational Services.

*Epigraphia Zeylanica, Vol. III.* (1994). Don Martino de Silva Wickramasinghe & H.W. Codrington. (ed.). New Delhi: Asian Educational Services.

*Epigraphia Zeylanica, Vol. IV.* (1994). H.W Codrington & S.Paranavitana. (Ed.). New Delhi: Asian Educational Services.

*Inscriptions of Ceylon, Vol. II, Part I.* (1983). S. Paranavithana. Colombo: Published by the Department of Archaelogy.

*Inscriptions of Ceylon, Vol. II, Part II.* (2001). S. Paranavithana, ed. Malani Dias. Colombo: Published by the Department of Archaelogy Sri Lanka.

*Pali Dictionary*. (1993). Delhi: Pali Tex.

Perera, L.S. *Institution of Ancient Ceylon from Inscriptions*. (2001). Ph.D. Dissertation, Peradeniya: University of Ceylon.

Siriweera W.I., 'The Theory of the Kings Owership of Land in Ancient Ceylon : An essay in Historical Revision'(Ed.) The Ceylon Journal of Historical and Social Studies 1971, 1960, pp. 10-18.